# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය

## ජනවාරි- දෙසැම්බර්,2017



*2017 මැයි 18 වැනි දින, මුලතිවු දිස්ත්‍රික්කයේ මුල්ලෙවයික්කාල් වෙරළ ආසන්නයේ ශාන්ත පෝල් කතෝලික දේවස්ථානයේ දී යුද්ධයේ දී අවසාන භාගයේ දී මිය ගිය අය සිහි කිරීමට සිහි කිරීමේ ආගමික වතාවත් පැවැත්වුනු අතර, සංවිධායකයෝ තදබල සීමාවලට සහ හිරිහැරවලට ලක් වූහ. ඡායාරූපය -ශ්‍රී ලංකා බ්‍රීෆ්*

**ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රය, කොළඹ, ශ්‍රී ලංකාව.**

ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය : ජනවාරි- දෙසැම්බර්, 2017
© ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රය, 2018

කොළඹ ශ්‍රී ලංකාව

බ්ලොග් අඩවිය: https://ihrdc.wordpress.com/
ඊමේල් ලිපිනය: informcolombo@gmail.com

ඉන්ෆෝම් 1990 දී පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම ජනවාර්ගික අර්බුදය සහ යුද්ධය යන සන්දර්භයේදී මානව හිමිකම් තත්වය ගැන අධීක්ෂණය සහ ලේඛනගත කිරීමට මෙන්ම ප්‍රාදේශීය, ජාතික සහ අන්තර්ජාතික තලයන්හිදී ලිඛිතව සහ වාචිකව එම තත්වය වාර්තා කිරීමටයි. එසේම ඉන්ෆෝම් සිය අයිතිවාසිකම් නිතර සහ ක්‍රමානුකූල ලෙස උල්ලංඝණය වෙන  අනෙකුත් ප්‍රජාවන් සමග ද වැඩ කර ඇත. වර්තමානයේ, ඉන්ෆෝම් ඡන්ද නිරීක්ෂණය, ප්‍රකාශනයේ නිදහස සහ මානව හිමිකම් ක්‍රියාධරයන් ඉලක්ක කර ගනිමින් වැඩ කරයි. ශ්‍රී ලංකාවේ, කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයන්, කණ්ඩායම් සහ ජාල සමග මෙන්ම, කලාපීය (ආසියානු), සහ අන්තර්ජාතික මානව හිමිකම් ජාල සමග ද කිට්ටුවෙන් කටයුතු කරයි.

## ප්‍රධාන නැඹුරුතාවයන් සහ සුවිශේෂී සිද්ධි

i. උතුරු නැගෙනහිර: පහරදීම්, තර්ජන, බිය ගැන්වීම්, රඳවා තබා ගැනීම, ප්‍රශ්න කිරීම සහ අවේක්ෂණය (Surveillance).

ii. පැහැර ගැනීම්, අත්අඩංගුවට ගැනීම්, සහ බය ගැන්වීම්

iii. පහර දීම් සහ විරෝධතාවලට සීමා

iv. මාධ්‍යයට එරෙහි ක්‍රියා

v. නීතිඥයන්ට සහ සාක්කිකරුවන්ට එරෙහි ක්‍රියා

vi. රජයේ නිලධාරීන් සහ දේශපාලනඥයන් විසින් කරන ලද මර්දනකාරී ප්‍රකාශ

# අන්තර්ගතය


අ. හැඳින්වීම ......................................................................................................................5

**i.** ක්‍රමවේදය සහ අරමුණ ....................................................................................................5

**ii.** සන්දර්භය සහ විධායක සාරාංශය ...........................................................................................5

**iii.** ප්‍රධාන සිද්ධි හය (6).....................................................................................................6

***1.*** *සුදේශ නන්දිමාල් මහතා (දකුණේ සිදු වූ සිරගෙදර සමූල ඝාතනය සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂිකරුවෙක් සහ ක්‍රියාකාරිකයෙකි)*.........................................................................................7

***2.*** *සුජීව මංගල මහතා (කොළඹ සිටින, කම්කරු සංගම් නායකයෙකි)*..............................7

***3.*** *ලක්ෂාන් ඩයස් මහතා (කොළඹ සිටින මානව හිමිකම් නීතිඥයෙකි)*.............................8

***4.*** *එස්. චන්ද්‍රලීලා මහත්මිය (උතුරේ ඉඩම් අයිතිවාසිකම් ක්‍රියාකාරිනියකි)*................8

***5.*** *එම්. ඊශ්වරී මහත්මිය (ඇය අතුරුදහන් වීම්වලට හඬ නැගූ ක්‍රියාකාරිකයෙක් මෙන්ම, උතුරේ අතුරුදහන් වූ පුද්ගලයකුගේ බිරිඳකි)*..........................................................................9

*6.* *නැගෙනහිර මානව හිමිකම් ක්‍රියාකාරීකයෙක්*..........................................................10

ආ. ප්‍රධාන රටා සහ සැලකිය යුතු මට්ටමේ සිද්ධි ..................................................................11

**i.** උතුර සහ නැගෙනහිර: පහරදීම්, තර්ජන, බිය ගැන්වීම්, රඳවා ගැනීම්, ප්‍රශ්න කිරීම් සහ අවේක්ෂණය ...........................................................................................................................11

***1.*** වවුනියාවේ තරුණයන් විසින් පළ කළ ෆේස්බුක් පෝස්ටුවක් සම්බන්ධයෙන් පොලිස් ප්‍රශ්න කිරීම ...................................................................................................................................11

***2.*** මුලතිවු හි ප්‍රජා යුද සැමරුම් සංවිධායකයාට හිරිහැර කිරීම ....................................12

***3.*** උතුරේ අතුරුදහන්වීම්වලට එරෙහි ක්‍රියාකාරිනියට කළ පහර දීම .............................13

***4.*** උතුරේ ඉඩම් හිමිකම් ක්‍රියාකාරිනියගේ ඉඩම් රජයට අත්පත් කර ගැනීම....................13

**5.** *ඉරණයිතිවු පූජකවරයාට එරෙහිව පොලිස් තර්ජන* .....................................................14

**6.** *අභ්‍යන්තර ලෙස අවතැන් වූ ජනතාව විරෝධතාවයේ සහභාගී වීමෙන් වැළැක්වීමට බුද්ධි අංශ නිලධාරීන් සිදු කළ තර්ජන* ..........................................................................................15

7. *ශ්‍රී ලංකා ගුවන් හමුදාව මානව හිමිකම් ක්‍රියාකාරිකයා නැවත පදිංචි කළ ගම්මානයකට යෑමේ දී ප්‍රශ්න කිරීමට ලක් කරයි* ...............................................................................15

8. *නැගෙනහිර පළාතේ ක්‍රියාකාරිකයකුට සිදු කළ අවේක්ෂණය, බිය ගැන්වීම සහ ලිංගික අඩන්තේට්ටම්*............................................................................................................16

*9.* *උතුරේ ක්‍රියාකාරිකයකු අවේක්ෂණය*........................................................................16

10. *ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාන්තා ජාලය වැටලීම* ......................................................17

**11.** *මඩකලපුවේ කාන්තා සංවිධානයකට පොලිස් සහ මිලිටරි හිරිහැර*.............................18

**12.** *ත්‍රස්තවාදී විමර්ශන ඒකකය මන්නාරම සිවිල් සමාජ නායකයා කැඳවයි*.......................18

**ii.** පැහැර ගැනීම්, අත්අඩංගුවට ගැනීම සහ බිය වැද්දීම......................................................19

**13.** *කම්කරු නායකයකු පැහැර ගැනීම*..................................................................................19

***14.*** *ශිෂ්‍ය ක්‍රියාකාරිකයා පැහැර ගැනීමට උත්සාහ කිරීම*.........................................................20

**15.** *ශිෂ්‍ය ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගැනීම*..........................................................................21

**iii.** විරෝධතාවයන්ට සීමා සහ ප්‍රහාර .....................................................................................22

**16.** *උසාවි නියෝග*.........................................................................................................22

**17.** *කඳුළු ගෑස්, ජල ප්‍රහාර සහ පහර දීම්*..............................................................................23

**iv.** මාධ්‍ය මර්දනය, විශේෂයෙන්ම දෙමළ ජනමාධ්‍යවේදීන් ..................................................25

***18.*** *යාපනය ජනමාධ්‍යවේදීන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රශ්න කිරීමට ලක් කර සිංහලෙන් ලියූ ප්‍රකාශයක් අත්සන් කිරීමට කියයි*.........................................................25

***19.*** *දෙමළ ගුවන් විදුලි ජනමාධ්‍යවේදියාට යාපනයේ දී කළ ප්‍රහාරය*.......................................26

***20.*** *මුලතිවු හි ජනමාධ්‍යවේදීන් 8 දෙනෙක් රඳවා තබා ගැනීම*...............................................26

***21.*** *මුලතිවු හි ජනමාධ්‍යවේදියකුට කළ පහර දීම* ....................................................................26

*22.* *මරුතකර්නි විරෝධතාවය ආවරණය කළ ජනමාධ්‍යවේදීන්ට කළ බිය ගැන්නවීම්* .......26

*23.* *පොලිසිය හම්බන්තොට ජනමාධ්‍යවේදියෙකුට පහර දෙයි*...................................................27

**24.** ඊ නිවුස් සහ අනෙකුත් වෙබ් අඩවි අවහිර කිරීම.................................................................27

**v.** නීතිඥයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහි පලිගැනීම් ...........................................................28

**25.** *ආගමික සුළුතරයන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය මානව හිමිකම් නීතිඥයාට තර්ජන* 28

**26.** *මානව හිමිකම් නීතිඥයාට කළ පහර දීම*.........................................................................29

27. *සේනක පෙරේරා*.........................................................................................................31

28. *සුදේශ නන්දිමාල් ද සිල්වා* .........................................................................................31

**vi.** මානව හිමිකම් ක්‍රියාධරයන් අපකීර්තියට ලක් කෙරෙන ප්‍රකාශ........................................32

**29.** *ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් කළ ප්‍රකාශ* ..........................................................33

**30.** *රාජ්‍ය නොවන සංවිධාන සහ* LGBTIQ *ප්‍රජාවට විරුද්ධව හිටපු අධිකරණ අමාත්‍ය රාජපක්ෂ විසින් කරන ලද ප්‍රකාශ* ..................................................................................34

## අ. හැඳින්වීම

### i. ක්‍රමවේදය සහ අරමුණ

මෙම වාර්තාවෙන් බලාපොරොත්තු වෙන්නේ 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය සම්බන්ධයෙන් සාමාන්‍ය විග්‍රහයක් සහ ඇතැම් සුවිශේෂී සිද්ධි සම්බන්ධයෙන් දළ අවබෝධයක් ලබා දීමයි. තනි මාතෘකා 30ක් යටතේ සංවිධානය වී ඇති මේ වාර්තාවෙන්, සිද්ධි 30කට වඩා වැඩි ගණනක් ආවරණය වේ. එසේම මේ වාර්තාවෙන් උත්සාහ කරන්නේ මේ සිද්ධිවල දී නැවත නැවතත් සිදුවෙන රටාවන් විශ්ලේෂණය කිරීමට සහ 2017 වර්ෂයේ රජය විසම්මුතියට පහරදීමට යොදාගත් ක්‍රමවේදයන් ගැන අධ්‍යයනය කිරීමටත්ය. එක් අතකින් ක්‍රියාකාරීන් සමග එක්ව වැඩ කිරීමට රජය දරන දුර්වල උත්සාහයන් සහ පැහැර ගැනීම්, පහර දීම්, තර්ජන, බිය ගැන්වීම්, රඳවා ගැනීම්, ප්‍රශ්න කිරීම, අවේක්ෂණය (surveillance), උසාවි නියෝග ආදිය සමග ඇති නොගැලපීම හසු කර ගැනීමටත් මෙම වාර්තාව උත්සාහ කරයි.

මේ වාර්තාව ඉන්ෆෝම් වෙත වාර්තා වූ සිද්ධි, නිරීක්ෂණ සහ ඉන්ෆෝම් කාර්ය මණ්ඩලයේ අත්දැකීම් මෙන්ම දේශීය සහ අන්තර්ජාතික මාධ්‍යවල වාර්තා වූ සිද්ධි මෙන්ම ලංකාවේ සහ ලංකාව සම්බන්ධයෙන් විවිධ මානව හිමිකම් සංවිධාන වෙතින් ප්‍රකාශයට පත් කළ ලේඛන යොදා ගනිමින් කරන ලද්දකි.

### ii. සන්දර්භය සහ විධායක සාරාංශය

2017 වසර විරෝධතාවලින් පිරුණු වසරක් විය. දිවයින පුරා පුළුල් පරාසයක ගැටළු සම්බන්ධයෙන් බිම් මට්ටමේ කැළඹීම් ඇති වූ අතර, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම, හමුදාව අත්පත් කර ගත් ඉඩම් සහ දේශපාලන සිරකරුවන් වැනි යුද්ධයට සම්බන්ධ අසාධාරණකම්වල සිට, කොන්ත්‍රාත්තු ශ්‍රමය, වෛද්‍ය අධ්‍යාපනය පෞද්ගලීකරණය වැනි සමාජ ආර්ථික ගැටළු ද මේ විරෝධතාවලට හේතු විය. යුද්ධයේ දී ඝාතනය වූ දෙමළ ජනතාව සිහි කිරීම, විවිධ මට්ටමින් සිදුවූ මර්දනයන්ට ලක් වූ අතරම, එකී මර්දනයන්ට එරෙහිව යුද්ධයේ බලපෑමට, ප්‍රචණ්ඩත්වයට සහ අසාධාරණයට ලක් වූ දෙමළ ජාතිකයන්ගෙන් පැමිණුනු වැඩිවෙන විරෝධය සහ අවනත නොවීම් ද සලකුණු කළේය.

2017 වසර සිරිසේන - වික්‍රමසිංහ රජය බලයට පත් වී ගෙවුනු 3 වැනි වසර වූ අතර, තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම, සහ තොරතුරු දැන ගැනීමේ කොමිසම පත් කිරීම, අතුරුදහන් වූවන්ගේ කාර්යාලය සම්බන්ධ නීතිරාමුව සකසා අවසන් කිරීම, උතුරේ හමුදාව යටතේ තිබූ ඇතැම් සිවිල් ඉඩම් නිදහස් කිරීම ආදී කුඩා පියවර කිහිපයක් 2015 වර්ෂයේ ලබා දුන් ඡන්ද පොරොන්දු ඉටු කිරීමට ගනු ලැබිය.

රජය විසින් එසේම මානව හිමිකම් ආරක්ෂකයන් සහ සිවිල් සමාජ සංවිධාන සමග සාකච්ඡා සහ සම්බන්ධතා පවත්වා ගැනීම වැඩියෙන් සිදු කරන බවක් පෙන්වූ අතර, එය එක්සත් ජාතීන්ගේ විශ්ව කාලාන්තර සමාලෝචනය වැනි ක්‍රියාදාමයන් හි දී සහ ඉහත සඳහන් කළ විරෝධතා ද ඇතුළුව අනෙක් කාරණාවලදී ද අවශ්‍ය වූ විට සිදු කරනු ලැබුනි. එසේ වුවත් සිදුවූ සාකච්ඡාවලින් බොහොමයක් බිම් මට්ටමේ වෙනසකට දායක වූයේ නැත. ඇතිව ඇති ගැටළු විසඳීමට අවංක කැපවීමක අඩුබව නිසා විරෝධතාකරුවන් විසින් ප්‍රතිඵල ලැබෙන තුරු විරෝධතාවය පවත්වා ගෙන යමින්, නැවත නැවතත් සාකච්ඡාවල යෙදීම සිදු කරන බැව් පෙනුනි. 2016 වසරේ රජය විසින් පත් කරන ලද සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධ ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ සොයා ගැනීම් සහ නිර්දේශවලින් බොහෝ ඒවා නොසලකා හැර ඇති බව පෙනුනු අතර, නිල වශයෙන් සහ සැලකිය යුතු මට්ටමකින් රජයේ ප්‍රතිචාරයක් මාස 16කට වැඩි කාලයක් තිබුනේ නැත. සමස්තයක් වශයෙන්, මහජන අදහස් විමසීම් පෙනුනේ කොටු සලකුණු කරන අභ්‍යාසයක් ලෙස, එනම් යමක් කළ යුතු නිසා කරන දෙයක් ලෙසයි. ඒ අදහස් විමසීම්වලින් ලැබුනු බොහෝ සොයා ගැනීම් සහ නිර්දේශ නොසලකා හැරි අතර, ඇතැම්විට සඳහන් කරන්නේ වත් නැති විය.

මෙයින් කිසියම් මට්ටමකට වෙනස් දෙයක් වූයේ නම් ඒ 2016 වසරේ පත් කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව වූ අතර එහි සිවිල් සමාජ ක්‍රියාකාරීන්, විද්වතුන් සහ නීතිඥයන් විසින් බිම් මට්ටමේ ප්‍රජාවන් සමග අදහස් විමසීම් පවත්වමින් ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා ජාතික එකගතාවය ගැන සිදු කළ මහජන අදහස් විමසීම වෙන අතර, මෙය (පාර්ලිමේන්තුවේ) ව්‍යවස්ථාදායක සභාවේ උප කමිටු සහ මෙහෙයුම් කමිටු වාර්තාවල සඳහන් වුවත්, අලුත් ව්‍යවස්ථාවක් සඳහා කෙටුම්පතක් ඇති කිරීමට එහි වැඩිහරියක් දායක වේ යැයි කිසිදු ඇඟවීමක් නැත.

සාකච්ඡා සහ අදහස් විමිසීම් සමගම පසෙකින් විසම්මුතිය මර්දනය අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2017 වර්ෂයේ මේ රජය යටතේ පළමු වරට ප්‍රසිද්ධ මානව හිමිකම් ක්‍රියාධරයකු තර්ජන නිසා රටහැර යාම සිදු වූ අතර, ඒ කොළඹ මානව හිමිකම් නීතිඥයකු වන ලක්ෂාන් ඩයස්ට ඔහු විසින් ඉවාන්ජෙලික ක්‍රිස්තියානි කණ්ඩායම් වෙත සිදු වෙන ප්‍රහාර ගැන ප්‍රසිද්ධියේ කතා කිරීම නිසා එවකට අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂගේ තර්ජනයන්ට ලක් වූ බැවින් තාවකාලික රට හැර යාමට සිදු වීමයි. එසේම 2017 වර්ෂයේ දකුණේ තවත් සැලකිය යුතු පැහැරගැනීම් දෙකක් සිදු විය: මින් පළමු වැන්න වන්නේ කම්කරු අයිතිවාසිකම් වර්ජනයකට නායකත්වය දුන් වෘත්තීය අයිතිවාසිකම් සංගමයක නායකයකු පැහැර ගැනීම; සහ දෙවැන්න වන්නේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පිහිටුවීමට විරුද්ධව විරෝධතා දක්වන ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු පැහැර ගැනීමට උත්සාහ කිරීමයි. එසේම 2017 මැයි මාසයේ දී, මුලතිවු හි කතෝලික පූජකවරයකුට එරෙහිව 2009 පැවැති යුද්ධයේ අවසාන අදියරයන්හි දී මියගිය අය සිහිපත් කිරීම වෙනුවෙන් මැයි 18 වැනිදා සංවිධානය කළ උත්සවයක් නැවැත්වීම සඳහා උසාවි නියෝගයක් නිකුත් කරන ලදී. ඊට අමතරව කම්කරු සහ ශිෂ්‍ය ක්‍රියාකාරීන් විසින් කොළඹ සහ ඒ අවට සිදු කරන ලද විරෝධතා මැඩ පැවැත්වීමට ද උසාවි නියෝග භාවිතා විය. මීතොටමුල්ල කුණු කන්ද නාය යාමෙන් පසුව, කොළඹ අවට සිටි පදිංචිකරුවන් කුණු දැමීමට එරෙහිව විරෝධතා සිදු කළ අවස්ථාවේ, ජනාධිපති සිරිසේන විසින් ගැසට් ප්‍රකාශයක් නිකුත් කරමින් කුණු බැහැර කිරීම අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කළ අතර, මේ හරහා හානිදායි සහ විෂසහිත ද්‍රව්‍ය තම නිවෙස් ආසන්නයේ බැහැර කිරීමට විරුද්ධ වූ අනතුරට භාජනය විය හැකි ප්‍රජාවන් ඒ සම්බන්ධයෙන් විරුද්ධ වීම සාපරාධී කරන ලදී.

ඒ අතරම පැරණි, විසම්මුතිය මර්දනය කිරීමේ දී බොහෝ විට පැහැදිලි උපක්‍රම වන පහරදීම්, තර්ජනය කිරීම, බිය ගැන්නවීම, රඳවා තබා ගැනීම, ප්‍රශ්න කිරීම සහ නිතර පරීක්ෂාවට ලක් කිරීම ආදිය ද දිගටම සිදු වූ අතර, විරෝධතා සහ වෙනත් විසම්මුති ක්‍රියාකාරකම් සිදු වෙන්නට පෙරම වසා දැමෙන පරිදි උසාවි නියෝග භාවිතා කිරීම වැඩි වැඩියෙන් දක්නට ලැබුනි. පහත දැක්වෙන සිද්ධි 6, රට පුරා විවිධ ප්‍රදේශවල සිදු වූ ඒවා වෙන අතර, රටේ අයිතිවාසිකම් සහ සමාජ යුක්තිය සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් විසම්මුතිය මර්දනය වීමේ රටාවන් පෙන්නුම් කරයි.

## <u>iii.</u> <u>ප්‍රධාන සිද්ධි හය (6)</u>

2017 වසරේ විසම්මුතිය මර්දනය කිරීම සම්බන්ධයෙන් වූ සියලු සිද්ධි සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු එක්රැස් කිරීම එක්කෝ දුෂ්කර ය, නැතිනම් කළ නොහැකි කාර්යයකි. ඉන්ෆෝම් විසින් මේ කොටසේ පහත ප්‍රධාන සිද්ධි 6 ඉදිරිපත් කරන්නේ ප්‍රධාන ගැටළු දැක්වෙන පරිදි ය. මෙයින් 5ක් පදනම් වී ඇත්තේ සිද්ධියට පාත්‍ර වූ පුද්ගලයන් සමග කරන ලද සාකච්ඡා තුළින් වෙන අතර, අනෙක පදනම් වෙන්නේ වින්දිතයා විසින් පුවත්පතකට සපයන ලද විස්තරාත්මක සම්මුඛ සාකච්ඡාවක් තුළිනි. මේවා හරහා පැහැරගැනීම්, පහර දීම්, ලිංගික අඩන්තේට්ටම්, වෙඩි තැබීම්, ජංගම දුරකථන තර්ජන, ප්‍රසිද්ධියේ කරන ලද තර්ජන, දේපල රජයට පවරා ගැනීම ආදියට සම්බන්ධ ගැටළු ඉස්මතු කරයි. එසේම මේ සිද්ධි 6න් කාන්තාවන් සහ පිරිමින් ද, දෙමළ සහ සිංහල, රටේ විවිධ කොටස්වලින් එනම් උතුර, නැගෙනහිර, දකුණ, සහ කොළඹ ලෙස නියෝජනය වේ. එසේම ඒවා විසින් මිලිටරිකරණය, හමුදාව විසින් ඉඩම් අත්පත් කර ගෙන සිටීම, බලහාත්කාරයෙන් අතුරුදහන් කිරීම, සිර ගෙදර සමූලඝාතනය, ආගමික නිදහස, කම්කරු අයිතිවාසිකම් ආදී විවිධ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන පුද්ගලයන්ට එරෙහිව සිදුවන හිරිහැර නියෝජනය කරයි.

**1. *සුදේශ නන්දිමාල් මහතා (දකුණේ සිදු වූ සිරගෙදර සමූල ඝාතනය සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂිකරුවෙක් සහ ක්‍රියාකාරිකයෙකි)***




*ඡායාරූපය: සුදේශ් නන්දිමාල් මාධ්‍ය හමුවක කතා කරයි. දකුණෙන් සිටින්නේ ඔහුගේ නීතිඥ සේනක පෙරේරා ය. ඡායාරූපය - අද දෙරණ*

නන්දිමාල් වැලිකඩ සිරගෙදර හිටපු සිරකරුවෙක් මෙන්ම, 2012 වර්ෂයේ දී සිරකරුවන් 27 දෙනෙකු ඝාතනය කරමින්, පොලීසිය, සොල්දාදුවන් සහ සිරගෙදර ආරක්ෂකයකු ඇතුළු, 40 දෙනෙකුට තුවාල සිදු කරමින් සිදු වූ බිහිසුණු වැලිකඩ සිරගෙදර කැරැල්ලේ ඇසින් දුටු සාක්ෂිකරුවෙකි. ඔහු සිරකරු අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රබල හඬක් නැගූවෙක් වෙන අතර, සිරකරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කමිටුවේ ලේකම් තනතුර දරයි. ඔහු තර්ජන සහ බිය ගැන්වීමේ ක්‍රියා ගණනාවකට පාත්‍ර වී ඇත. ජූලි 11 වැනි දා, නන්දිමාල් සහ ඔහුගේ නීතිඥයාට යන දෙදෙනාටම  බිය ගෙන දෙන, නිර්නාමික දුරකථන ඇමතුම් ලැබුනු අතර, ඒවායෙන් අනතුරු අඟවා සිටියේ ඔහු නඩුව සම්බන්ධයෙන් දිගටම සටන කර ගෙන යන්නේ නම් “ප්‍රශ්න”වලට මුහුණ පෑමට සිදුවනු ඇති බවයි. සැප්තැම්බර් මාසයේ,  ඔහු නතරව සිටින නිවසට වෙඩි ප්‍රහාර එල්ල වූ අතර, පොලීසියට ඒ ගැන පැමිණිලි කළත් ඒ සම්බන්ධයෙන් කිසිවකුට එරෙහිව නීතිමය කටයුතු කර නැත.

**2. *සුජීව මංගල මහතා (කොළඹ සිටින, කම්කරු සංගම් නායකයෙකි)***



*ඡායාරූපය: සමස්ත ලංකා විදුලි සංදේශ සේවක සංගමයේ උප සභාපති  සුජීව මංගල*

මංගල යනු සමස්ත ලංකා විදුලි සංදේශ සේවක සංගමයේ උප සභාපති ය.  ඔහු විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ මැන්පවර් සේවකයන්ට සමාන ලෙස සැලකීම, වන්දි සහ ප්‍රතිලාභ එකම වගකීම් බෙදා ගන්නා පූර්ණ කාලීන සේවකයන්ට හා සමානවම ලබා දෙන ලෙස ඉල්ලමින් සිදු කළ ප්‍රධාන වැඩවර්ජනයකට සංවිධානය කිරීම සහ නායකත්වය ලබා දීමට තදින් සම්බන්ධ වී කටයුතු කළේය. මංගල ජනවාරි 28 වැනි දා, සේවක සංගම් කාර්යාලයෙන් පිටව ගියේ රැස්වීමකට පසුව ඔහුගේ යතුරුපැදියෙන් නික්ම ගියේ රාත්‍රියේ පසුභාගයේ ය. මංගල තමන්ව කලු වෑන් රථයක් විසින් ලුහු බඳින බව දැක ඇති අතර, ඔවුන් අවසානයේ මංගලව පසු කර මග අවහිර කරමින් වාහනය නවත්වා ඇත. වෑන් රථයෙන් පැමිණි සන්නද්ධ පුද්ගලයන් තිදෙනෙක් මංගලව දෑත්වලින් අල්ලා ගෙන ඇති අතර,

හිස ආවරණය කරමින් බෑගයක් දමා ඇත. ටික වේලාවකට පසුව මංගල දැක ඇත්තේ තමන් අත් හැර දැමූ පාළු නිවසක සිටින බවයි. ඔහුව එහි දින 3ක් රඳවා ගෙන ඔහුට කියා ඇත්තේ වැඩ වර්ජනය නතර කරන ලෙසයි. පසුව ඔහුව ඇස් බැඳ, පාර අයිනේ දමා ගොස් ඇත.

### *3. ලක්ෂාන් ඩයස් මහතා (කොළඹ සිටින මානව හිමිකම් නීතිඥයෙකි)*



*මානව හිමිකම් ආරක්ෂක ලක්ෂාන් ඩයස් රැස්වීමක් අමතමින්. ඡායාරූපය ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය*

මානව හිමිකම් ක්‍රියාකාරී සහ මානව හිමිකම් නීතිඥ ලක්ෂාන් ඩයස්, ජුනි 14 වැනිදා, ජාතික රූපවාහිනි නාලිකාවක දී ශ්‍රී ලංකාවේ කතෝලික නොවන ක්‍රිස්තියානි පුද්ගලයන්ට එරෙහිව දිගින් දිගටම සිදු වෙන පහර දීම් ගැන කතා කළෙය. දින කිහිපයකට පසුව, එවකට අධිකරණ හා බුද්ධ ශාසන අමාත්‍ය විජේදාස රාජපක්ෂ මේ චෝදනාවලට පලි ගැනීමක් වශයෙන්, සහ ඒවා බොරු බව ප්‍රකාශ කරමින්, ඩයස් මහතාගේ නීතිඥ වෘත්තිය අහිමි කිරීමට කටයුතු කරන බවට ඍජුව තර්ජනය කළේය. නීතිමය වශයෙන් එසේ කිරීමට බලයක් ඇමැතිවරයාට ඇත්තේ නැත. තමන්ගේ රැකියාවට සහ තමන්ට ඇති පැහැදිලි තර්ජනය වටහා ගත් ඩයස්, තමන්ට පසුගිය රෙජීමය යටතේ බරපතල තර්ජන තිබියදී පවා රට හැර නොගිය නමුත්, මෙවර තාවකාලිකව රට හැර ගියේය.

### *4. එස්. චන්ද්‍රලීලා මහත්මිය (උතුරේ ඉඩම් අයිතිවාසිකම් ක්‍රියාකාරිනියකි)*



*චන්ද්‍රලීලා කෙප්පාපුලවු විරෝධතාවයක් අතරතුර සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින්,*
*ඡායාරූපය - ශිරාන් ඉලන්පෙරුම*

චන්ද්‍රලීලා මුලතිවු හි බිම් මට්ටමේ ක්‍රියාකාරිකයෙක් සහ සංවිධායකයෙකි. කේප්පාපුවලවු ග්‍රාමීය කාන්ත සංවර්ධන සමිතියේ සභාපති ධූරය දරන ඇය, හිටපු ගුරුවරියකි. උතුරේ ඇය ප්‍රසිද්ධ ප්‍රජා නායිකාවක් වෙන අතර, හමුදාවෙන් අත්පත් කරගත් අවතැන් වූ කේප්පාපුලවු ජනතාවගේ ඉඩම් අරගලයේ දී විරෝධතා සංවිධානයේ දී වැදගත් භූමිකාවක් ඉටු කළේය. මේ අරගලය අතරතුර, චන්ද්‍රලීලා අවස්ථා ගණනකදී පුවත්පත් සහ විකාශන මාධ්‍ය විසින් සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලදී. ගුවන් හමුදාව විසින් අත්පත් කර ගෙන තිබූ පිලකුඩිඉරුප්පු ගම්මානය නිදහස් කිර ගැනීමෙන් ටික වේලාවකට පසුව, චන්ද්‍රලීලාට අයිති ඔප්පු සහිත කෘෂිකාර්මික ඉඩමක්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කර ඇති බවයි. මේ තීරණය ගැන චන්ද්‍රලීලාගේ අදහස් විමසීමක් හෝ කලින් දැනුම් දීමක් සිදු නොවූ අතර, ඇයට මෙය දැන ගන්නට ලැබුනේ ඇය විසින් සේවයේ යෙදවූ සේවකයන්ට ඉඩමට ඇතුළු වීම ගුවන් හමුදා නිලධාරීන් විසින් වැලැක් වූ අවස්ථාවේය.

### 5. *එම්. ඊශ්වරී මහත්මිය (ඇය අතුරුදහන් වීම්වලට හඬ නැගූ ක්‍රියාකාරිකයෙක් මෙන්ම, උතුරේ අතුරුදහන් වූ පුද්ගලයකුගේ බිරිඳකි)*



***2017 අගෝස්තු 4 වැනි දින, අතුරුදහන්වූවන්ගේ මව්වරුන්ගේ මුලතිවු හි දී විරෝධතාවයට දින 150ක් සම්පූර්ණ විය. ඡායාරූපය - ටැමිල් ගාඩියන්***

ඊශ්වරීගේ සැමියා අතුරුදහන්ව ඇත්තේ හමුදාව විසින් රැගෙන යාමෙන් අනතුරුවය. එතැන් පටන් ඔහුව සොයා ගැනීමට යලි යලිත් දැරූ සියලු උත්සාහයන් නිරර්ථක වී ඇත. එතැන් සිට ඊශ්වරී විසින් අතුරුදහන් වූ අනෙකුත් පවුල් සාමාජිකයන් සමග එක්ව විරෝධතා සංවිධානය කර ඇත. 2017 අගෝස්තු 14 වැනි දින, මුලතිවු හි අතුරුදහන් වූවන්ගේ පවුල් විසින් මාස 5ක් තිස්සේ ගෙන ගිය (දැන් මාස 14කට වැඩි), විරෝධතාවයට නායකත්වය දුන් ඊස්වරී හට එක් දිනක් රාත්‍රියේ නිවසට යමින් සිටියදී යතුරුපැදිකරුවන් විසින් තර්ජනය කර ඇත. වාර්තාවලට අනුව, ඇයව අතපත ගා සහ ඇගේ කනට පහර දී, විරෝධතාවය තවදුරටත් කර ගෙන නොයන ලෙස ඇයට කියා ඇත. "තමුසෙ මේක නැවැත්තුවොත්, අනිත් අයත් නවත්තාවි. නැවැත්තුවේ නැත්නම් තමන්ට දරුණු ප්‍රතිඵලවලට මුහුණ දෙන්න වේවි" කියා ඇයට කියා තිබුනි. පසුදින අගෝස්තු 15 වැනි දා, පහර දීමෙන් වූ තුවාලවලට ප්‍රතිකාර ලබා ගැනීමට රජයේ රෝහලට ගිය අවස්ථාවේ, පොලීසියට ප්‍රකාශයක් ලබා දීමට ඇයව යොමු කර තිබුනි. කෙසේවුවත් අගෝස්තු 20 වැනිදා, ඇය හමුවීමට පැමිණි පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ප්‍රකාශයක් ලබා ගැනීමට ඇය කැටුව යාමට පෙළඹවීමට උත්සාහ කර ඇති නමුත්, තමන්ගේ නීතිඥයා නොමැතිව එහි යාම ඇය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

## *6. නැගෙනහිර මානව හිමිකම් ක්‍රියාකාරීකයෙක්*


2017 වසරේ පසු භාගයේ, රජය විවේචනය කරන ලද කතාවක් පැවැත්වීමෙන් පසුව මානව හිමිකම් ක්‍රියාකාරිකයකු සිය නිවසට ආපසු යමින් සිටියේය. මේ ක්‍රියාකාරිකයා වෙතට සිවිල් ඇඳුමෙන් පැමිණි පුද්ගලයකු තමන් පොලීසියේ යැයි පවසමින් ඔහුගෙන් ප්‍රශ්න කර සිටියේය. ඔහුගේ බෑගයේ තිබූ දේවල් පෙන්වන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ, ක්‍රියාකාරිකයා විසින් අනික් පුද්ගලයාගේ හැඳුනුම්පත දකින තෙක් එසේ කළ නොහැකි බව කියා සිට ඇත. ඉන්පසු ඔහුව වහා අනෙක් නිලධාරීන් විසින් වට කර ඇත. ඔහුව හිරිහැරයට භාජනය කිරීමෙන් අනතුරුව, සිවිල් ඇඳුමෙන් සිටි නිලධාරීන් තමන් සමග ඇවිද එන ලෙස ඔහුට බල කර ඇත. ක්‍රියාකාරිකයා විසින් තමන්ගේ ජංගම දුරකථනය භාවිතා කිරීමට උත්සාහ කර ඇතත්, වහා එය ඔහුගෙන් උදුරා ගෙන ඇත. අවසානයේ ඔහුව පාළු ස්ථානයක තිබූ පඩි පෙළක් වෙත රැගෙන ගොස් ඇති අතර, ඔහුගේ බෑගයේ තිබූ දේවල් නිලධාරීන් විසින් බිමට හිස් කර ඇත්තේ, එහි තිබූ ඇතැම් භාණ්ඩවලට හානි වෙන ආකාරයටය. නිලධාරීන් ඔහුට සැර පරුෂ භාෂාවෙන් කතා කර, ඔහුට පහර දී, පසුව ඔහුගේ සිරුර සෙවීමට ලක් කර ඇති අතර, ඒ අවස්ථාවේ නිලධාරීන් ඔහුගේ ලිංගේන්ද්‍රිය අතපත ගෑ බවටත් ක්‍රියාකාරිකයා චෝදනා කරයි. පසුව ඔහු මේ ගැන පොලීසියට පැමිණිලි කර ඇත.

## ආ. ප්‍රධාන රටා සහ සැලකිය යුතු මට්ටමේ සිද්ධි

### i. උතුර සහ නැගෙනහිර: පහරදීම්, තර්ජන, බිය ගැන්වීම්, රඳවා ගැනීම්, ප්‍රශ්න කිරීම් සහ අවේක්ෂණය

උතුර සහ නැගෙනහිර කලින් යුද්ධයේ බලපෑමට ලක් වූ ප්‍රදේශවල ක්‍රියාකාරීන් විසින් මුහුණ දෙන තත්වය රටේ අනිත් පැතිවලට වඩා දුෂ්කර වන අතර, අධික මිලිටරිකරණය විසින් නිරන්තර අවේක්ෂණය සහ බිය ගැන්වීම්වලට යොමු කෙරෙන අතර, රජයේ නිලධාරීන් විසින් ප්‍රජා කණ්ඩායම් විසින් ක්‍රියා සැලසුම්, අයවැය, කාර්ය මණ්ඩලයේ පෞද්ගලික විස්තර ආදිය සැපයීමට ඇති අවශ්‍යතාවයන් බවට පත් කර ඇත. 2015 දී රජය බලයට පත්වීමත් සමග තත්වය තරමක් පහසු වී ඇති බව සත්‍යයක් වුවත්, අඛණ්ඩව හමුදාව සිටීමත්, පොලීසියේ නිරන්තර අවේක්ෂණයත් විසින් සිවිල් වැසියන්ගේ ජීවිතයට බාධා කරන අතර, සිවිල් ක්‍රියාකාරීන්ගේ සහ සංවිධානගත වීම්වල සාමාන්‍ය කටයුතු සම්බන්ධයෙන් ජනතාවට එක් රැස්වීමට, ප්‍රකාශනයට, සංවිධානගත වීමට සහ පෞද්ගලිකත්වය ආදියට බාධා ඇති කරයි. ජනමාධ්‍යවේදීන්ට එරෙහිව සිදුව ඇති කඩවීම් වැඩි ප්‍රමාණයක්, මාධ්‍යවලට එරෙහි මර්දන යන කොටසේ දක්වන පරිදි උතුරෙන් වාර්තා වේ. පහත දැක්වෙන්නේ උතුර සහ නැගෙන හිර සම්බන්ධයෙන් මේ රටාවන් පැහැදිලි කරන සිද්ධි කිහිපයකි.

#### *1.* වවුනියාවේ තරුණයන් විසින් පළ කළ ෆේස්බුක් පෝස්ටුවක් සම්බන්ධයෙන් පොලිස් ප්‍රශ්න කිරීම




*රූපය: සිද්ධියට සම්බන්ධ ඡායාරූපය සමග ග්‍රවුන්ඩ්වීව්ස් වෙතින් නිකුත් කළ ට්විටර් පණිවුඩය*

නොවැම්බර් මාසයේ දී, උතුරු පළාතේ, වවුනියා දිස්ත්‍රිකක්කයේ තරුණයන් දෙදෙනෙකු විසින් වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දැක්වනෙ ඡායාරූපයක් ෆේස්බුක් හි පළ කරන ලදී. මෙය පළ කිරීමේ අරමුණ ලෙස පෙනුනේ ගස් වැවීමේ වැඩසටහනක් සම්බන්ධ පෝස්ටරයක් සහ එය පිටුපසින් ඇති විශාල ගසක් කපා දමා ලෙස පෙනෙන ආකාරය ගැන අවධානය යොමු කිරීමටයි. නොවැම්බර් 24 වැනිදා, පොලිසිය මෙම ඡායාරූපය පළ කළ තරුණයන් දෙදෙනා ප්‍රශ්න කිරීමට ලක් කරන ලදී. එහිදී තරුණයන් තේරුම් නොගත් භාෂාවකින් වූ, සිංහලෙන් ලියූ දිවුරුම් පෙත්සමක් අත්සන් කිරීමට ඔවුන්ට සිදු වූ අතර, ඔවුන්ගේ රැකියා අහිමි විය හැකි බවත්, ඔවුන්ට රජයේ ආයතනයක් ඡායාරූප ගත කිරීමකට ලක් කළ නොහැකි බවත්, ඒවායේ ක්‍රියා ප්‍රශ්න කළ නොහැකි බවත් පවසන ලදී. මේ සිද්ධිය පසුව අන්තර්ජාල එකමුතු ව්‍යාපාරයකදී[1] #justaphotolka හැෂ්ටැග් හරහා මතු විය. රටේ වෙනත් ප්‍රදේශවල රජයේ කාර්යාලවල ඡායාරූප පළ කළ කිසිවකුට විරුද්ධව මෙසේ හිරිහැර සිදු වී නැත. මේ සිද්ධිය විසින් භයානක පූර්වාදර්ශයක් සපයන්නේ පොලීසිය විසින් ගෙනෙනු ලබන චෝදනාවට

[1] http://groundviews.org/2017/12/14/justaphotolka-highlighting-and-pushing-back-against-ongoing-surveillance-in-vavuniya/

සහාය ලබා දීමට කිසිදු සුවිශේෂී නීතියක් හෝ රෙගුලාසියක් නොපවතින බැවිනි. මෙහිදී පැහැදිලිව පෙනෙන්නේ පොලීසිය විසින් ඒකපාර්ශ්වයිය ලෙස කතා කිරීමේ සහ අදහස් ප්‍රකාශනයේ නිදහස මැඩලීමට ක්‍රියා කළ බවයි.

## 2. මුලතිවු හි ප්‍රජා යුද සැමරුම් සංවිධායකයාට හිරිහැර කිරීම

මැයි 17 වැනිදා, මුලතිවු පොලීසිය වසින් මුලතිවු මහේස්ත්‍රාත් උසාවියෙන් නියෝගයක් ලබා ගෙන තිබුනේ රෝමානු කතෝලික දේවගැති එලීල් රාජේන්ද්‍රන් පියතුමා සහ අනෙකුත් අය විසින් යුද්ධයේ අවසාන අදියරේ දී මිය ගිය දෙමළ වින්දිතයන් වෙනුවෙන්, ප්‍රජාවේ අය විසින් සපයන ලද මිය ගිය අයගේ නම් කොටන ලද ගල් එකතුවක් ආසන්නයේ සිහිපත් කිරීමේ ආගමික වාරිත්‍ර සිදු කිරීම තහනම් කරමිනි.[2] මැයි 18 වැනිදා, මෙම නියෝගය එලීල් පියතුමාගේ නීතිඥයා විසින් අභියෝගයට ලක් කර අතර, නඩුවාරය අතරතුර පොලීසිය විසින් නිරීක්ෂකයන්ට අඛණ්ඩව බාධාකළ අතර, උසාවියේ කටයුතු වාර්තා කිරීමට උත්සාහ කළ ජනමාධ්‍යවේදීන්ට ද හිරිහැර කරන ලදී. උසාවියෙන් යෙදූ සීමාවන් සහිතව සිහිපත් කිරීමේ උත්සවය සිදු වෙද්දී, එලීල් පියතුමාට එරෙහිව දිගටම ක්‍රියාත්මක විය. ඔහු තේරුම් නොගත් සිංහලෙන් ලියූ සිතාසි ද රැගෙන පොලීසිය විසින් ඔහුගේ වාසස්ථානයට අඳුර වැටුණාට ද පසුව පැමිණියෝය. පසුව පොලිසිය විසින් ගල්වල කොටන ලද නම්වල සම්පූර්ණ ලැයිස්තුවක් ඉල්ලා සිටියේ එයින් කිසිවකු එල්ටීටීඊ හටයන් ද යන්න තහවුරු කර ගැනීමටය.



ඡායාරූපය: මියගිය පුද්ගලයන්ගේ නම් කොටන ලද ගල්. ඡායාරූපය - *ශ්‍රී ලංකා බ්‍රීෆ්*

මේ සිද්ධියෙන් සලකුණු කරන්නේ, දැන් යුද්ධය අවසන්ව වසර 8කට වැඩි කාලයක් ගතව ඇතත්, උතුර සහ නැගෙනහිර ප්‍රදේශවල ප්‍රජාව විසින් සංවිධානය කරන සිහිපත් කිරීමේ උත්සව සහ ස්මාරක සම්බන්ධයෙන් දිගින් දිගටම පවතින දුෂ්කරතාය. මෙවැනි සිහිපත් කිරීමේ කටයුතුවල සංවිධායකයන්ට දිගින් දිගටම

[2] https://roar.media/english/reports/reports/trials-of-memorialisation-continue-in-the-north-east/

අවේක්ෂණයටත්, හිරිහැර කිරීම්වලටත් ලක් වීමට සිදුවේ. මෙය සිදු වන්නේ උතුරේ, විශේෂයෙන්ම කිලිනොච්චි හා මුලතිවු හි රජය විසින් ආගන්තුක, මිලිටරිමය යුද ස්මාරක ගණනාවක් ඉදි කරන අතර සහ මීට පෙර තහනම් කළ ජනතා විමුක්ති පෙරමුණ (ජවිපෙ) වැනි සංවිධානවලට ප්‍රසිද්ධ සැමරුම් උත්සව පැවැත්වීමට අවසර ලබා දී තිබියදීය. ප්‍රජාවන් විසින් මෙහෙයවන සිහිපත් කිරීම් උත්සව උතුරේ සහ නැගෙනහිර දී මැඩ පැවැත්වීම සංහිඳියාවට බාධාවක්ව පවතී.

### *3.* උතුරේ අතුරුදහන්වීම්වලට එරෙහි ක්‍රියාකාරිනියට කළ පහර දීම



*මරියසුරේෂ් ඊශ්වරී මහත්මිය, ඡායාරූපය ජේඩීඑස් ලංකා*

මුලතිවු හි දෙමළ ජාතික කාන්තා ක්‍රියාකාරිනියක් වන, මරියසුරේෂ් ඊශ්වරී මහත්මියගේ සැමියා වන මරියදාස් මරියසුරේෂ් අතුරුදහන් වී ඇත්තේ හමුදාව විසින් රැගෙන යාමෙන් පසුවය. ඔහුව සොයා ගැනීමට නැවත නැවත කළ උත්සාහයන් නිරර්ථක වී ඇත. එතැන් පටන් ඇය අතුරදහන්වූවන්ගේ අනෙකුත් පවුල් සාමාජිකයන් ද හා එක්ව විරෝධතා සංවිධානය කර ඇත. 2017 අගෝස්තු 14 වැනි දින, මුලතිවු හි අතුරුදහන් වූවන්ගේ පවුල් විසින් මාස 5ක් තිස්සේ ගෙන ගිය (දැන් මාස 14කට වැඩි), විරෝධතාවයට නායකත්වය දුන් ඊස්වරී හට එක් දිනක් රාත්‍රියේ නිවසට යමින් සිටියදී යතුරුපැදිකරුවන් විසින් තර්ජනය කර ඇත. වාර්තාවලට අනුව, ඇයව අතපත ගා සහ ඇගේ කනට පහර දී, විරෝධතාවය තවදුරටත් කර ගෙන නොයන ලෙස ඇයට කියා ඇත. “තමුසෙ මේක නැවැත්තුවොත්, අනිත් අයත් නවත්තාවි. නැවැත්තුවේ නැත්නම් තමන්ට දරුණු ප්‍රතිඵලවලට මුහුණ දෙන්න වේවි” කියා ඇයට කියා තිබුනි.

පසුදින අගෝස්තු 15 වැනි දා, පහර දීමෙන් වූ තුවාලවලට ප්‍රතිකාර ලබා ගැනීමට රජයේ රෝහලට ගිය අවස්ථාවේ, පොලීසියට ප්‍රකාශයක් ලබා දීමට ඇයව යොමු කර තිබුනි[3]. කෙසේවුවත් අගෝස්තු 20 වැනිදා, ඇය හමුවීමට පැමිණි පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ප්‍රකාශයක් ලබා ගැනීමට ඇය කැටුව යාමට පෙළඹවීමට උත්සාහ කර ඇති නමුත්, තමන්ගේ නීතිඥයා නොමැතිව එහි යාම ඇය විසින් ප්‍රතික්ෂේප කර ඇත.

### *4.* උතුරේ ඉඩම් හිමිකම් ක්‍රියාකාරිනියගේ ඉඩම් රජයට අත්පත් කර ගැනීම

එස් චන්ද්‍රලීලා මහත්මිය මුලතිවු හි බිම් මට්ටමේ ක්‍රියාකාරිකයෙක් සහ සංවිධායකයෙකි. කේප්පාපුවලවු ග්‍රාමීය කාන්ත සංවර්ධන සමිතියේ සභාපති ධූරය දරන ඇය, හිටපු ගුරුවරියකි. උතුරේ ඇය ප්‍රසිද්ධ ප්‍රජා නායිකාවක් වෙන අතර, හමුදාවෙන් අත්පත් කරගත් අවතැන් වූ කේප්පාපුලවු ජනතාවගේ ඉඩම් අරගලයේ දී විරෝධතා සංවිධානයේ දී වැදගත් භූමිකාවක් ඉටු කළේය.[4] මේ අරගලය අතරතුර, චන්ද්‍රලීලා අවස්ථා ගණනකදී පුවත්පත් සහ විකාශන මාධ්‍ය විසින් සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලදී. දීර්ඝ කාලයක් තිස්සේ කර ගෙන ගිය විරෝධතාවලට පසුව, ගුවන් හමුදාව විසින් අත්පත් කර ගෙන තිබූ පිලකුඩිඉරුප්පු ගම්මානය නිදහස් කර ගැනීමෙන් ටික වේලාවකට පසුව, චන්ද්‍රලීලාට අයිති ඔප්පු සහිත කෘෂිකාර්මික ඉඩමක්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කර ඇති බවයි.[5] මේ තීරණය ගැන

---

[3] http://www.jdslanka.org/index.php/news-features/human-rights/704-sri-lanka-police-continue-harassment-of-tamil-woman-activist
[4] https://roar.media/english/life/reports/long-road-home-the-lives-of-mullaitivus-displaced/
[5] http://www.tamilguardian.com/content/land-return-activist%E2%80%99s-field-confiscated-sri-lankan-air-force-apparent-reprisal

චන්ද්‍රලීලාගේ අදහස් විමසීමක් හෝ කලින් දැනුම් දීමක් සිදු නොවූ අතර, ඇයට මෙය දැන ගන්නට ලැබුනේ ඇය විසින් සේවයේ යෙදවූ සේවකයන්ට ඉඩමට ඇතුළු වීම ගුවන් හමුදා නිලධාරීන් විසින් වැලැක් වූ අවස්ථාවේය.



*කේප්පාපුලවු හි ඉඩම් අයිතිවාසිකම් විරෝධතාවයක නියැලි කාන්තාවන් (චන්ද්‍රලීල විරෝධතාකරුවන් අතර සිටී), පෙබරවාරි, 2017. ඡායාරූපය–ටැමිල් ගාඩියන්*

චන්ද්‍රලීලා සහ අනෙකුත් ක්‍රියාකාරීන් දැඩි ලෙස සැක කරන්නේ ඇය බිම් මට්ටමේ විරෝධතාවය අඛණ්ඩව කර ගෙන යාමට සහ එයට නායකත්වය දීමට කළ කටයුතු හේතුවෙන්, මෙය රජය විසින් පලි ගැනීමට සිදු කළ ක්‍රියාවක් බවයි. චන්ද්‍රලීලාගේ කෘෂිකාර්මික ඉඩම අත්පත් කර ගැනීම ඇගේ ජීවිකාවට, ආර්ථික ආරක්ෂාවට සහ ස්ථාවරභාවයට එරෙහිව කරන ලද ඍජු පහර දීමකි.

## 5. *ඉරණයිතිවු පූජකවරයාට එරෙහිව පොලිස් තර්ජන*

1992 වර්ෂයේ දී, පවුල් 242කට පමණ ඉරණයිතිවු නම් කුඩා දිවයිනෙන් ඉවත් වීමට බල කරන ලදී[6]. 2017 වසරේ දී, මේ පවුල් මේ පවුල් විසින් තමන්ගේ නිවාසවලට සහ, තමන්ගේ සම්ප්‍රදායික ජීවිකාව කර ගෙන ගිය ඉඩම්වලට ආපසු යාමට ඉඩ දෙන ලෙස ඉල්ලමින් ඔවුන් දශක ගණනාවක් තිස්සේ කරන ඉල්ලීම අඛණ්ඩව සිදු කරන ලදී. 2017 මැයි 1 වැනිදා ඔවුන් මේ ගැන අඛණ්ඩ විරෝධතාවයක් ආරම්භ කළහ.මේ විරෝධතාවලට සහාය දුන් කෙනෙක් වූයේ ප්‍රජා නායකයකු සහ ඉරණයිමතානගර් පල්ලියේ මීසම භාර කතෝලික පූජකවරයා වූ පූජ්‍ය. අරුල්වෙල්වන් පියතුමා ය. ඉරණයිතිවු හි පදිංචිකරුවන් විසින් 54 වැනි දිනටත් සංවිධානයක කළ අඛණ්ඩ විරෝධතාවයේ දී, විරෝධතාකරුවන් විසින් මාර්ගය අවහිර කරන ලදී[7]. මේ අවස්ථාවේ දී ප්‍රජාවට සහයෝගය දෙමින් එතැන සිටි පූජකවරයා වෙත පැමිණි පොලිස් නිලධාරීන් විසින් ඔහුට තර්ජනය කරන ලදී.

මන්නාරම දියෝකීසියේ කතෝලික සංගමය විසින් මෙම සිද්ධිය ද, පොලීසිය සහ හමුදාව විසින් ක්‍රියාකාරීන්ට සහ ආගමික නායකයින්ට එරෙහිව නිතර කරන තර්ජන ද හෙළා දකින ලදී. මේ සිද්ධිය උතුර

[6] http://www.tamilguardian.com/content/irainativu-villagers-demand-return-land-sri-lankan-navy

[7] http://www.tamilguardian.com/content/sl-police-threats-against-protesting-mannar-priest-condemned-catholic-diocese

සහ නැගෙනහිර සිදු වෙන මෙවැනි බොහෝ සිද්ධිවලින් එකක් පමණක් වන අතර, සාමකාමී විරෝධතාකරුවන් සහ ඔවුන්ට සහයෝගය දක්වන්නන් බිය වැද්දීම්වලට ලක් කරමින් පොලීසිය සහ ආරක්ෂක අංශ විසින් ඔවුන්ගේ බලය වැරැදි ලෙස භාවිතා කරන අවස්ථා එමටය.

## 6. *අභ්‍යන්තර ලෙස අවතැන් වූ ජනතාව විරෝධතාවයේ සහභාගී වීමෙන් වැළැක්වීමට බුද්ධි අංශ නිලධාරීන් සිදු කළ තර්ජන*

2017 පෙබරවාරි මාසයේ, පිලකුඩිඉරුප්පු ගම්මානයේ අවතැන් වූ පදිංචිකරුවන් තමන්ගේ ඉඩම් හමුදා ග්‍රහණයෙන් මුදා හරින ලෙස ඉල්ලමින් විරෝධතාවයක් ආරම්භ කරන ලදී. උතුරේ අනෙකුත් ප්‍රජාවන් ද මේ කාලයේම විරෝධතාවයන් ආරම්භ කරන ලදී. දීර්ඝ කාලයක් තිස්සේ පැවැතුනු මේ විරෝධතාවයන් බැලීමට දිවයිනේ විවිධ පෙදෙස්වලින් අමුත්තන් පැමිණි අතර, විරෝධතාකරුවන්ට සහයෝගය ද වැඩි කරන ලදී.

ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය (NAFSO) එවැනි සහයෝගිතා විරෝධතාවයක් යාපනයේ දී සංවිධානය කරන ලදී. මේ විරෝධතාවයට කොළඹ, ත්‍රිකුණාමලය සහ මන්නාරම ආදී ප්‍රදේශවලින් වෙනත් ක්‍රියාකාරිහු ද පැමිණියහ. විරෝධතාකරුවන් පසුව දැන ගත්තේ බුද්ධි අංශ විසින් විරෝධතාවයට පැමිණීමට සිටි යාපනයේ අභ්‍යන්තර ලෙස අවතැන් වූ අයගේ කඳවුරකට පැමිණ ඇති බවයි[8]. එක් ප්‍රජා නායකයකු අන් අයගෙන් වෙන් කර පසෙකට ගෙන, නිලධාරීන් විසින් අභ්‍යන්තර ලෙස අවතැන් වූ ජනතාව බිය ගන්වා ඇති අතර, විරෝධතාවයට නොපැමිණෙන ලෙස ඔවුන්ට බලපෑම් කර ඇත.

## 7. *ශ්‍රී ලංකා ගුවන් හමුදාව මානව හිමිකම් ක්‍රියාකාරිකයා නැවත පදිංචි කළ ගම්මානයකට යෑමේ දී ප්‍රශ්න කිරීමට ලක් කරයි*




*සිද්ධිය ගැන රුකී ප්‍රනාන්දු පළ කල ට්විටර් පණිවුඩය*

2017 මැයි 9 වැනිදා, කොළඹ සිටින මානව හිමිකම් ක්‍රියාකාරිකයෙක් වෙන රුකී ප්‍රනාන්දු ඊට දින කිහිපයකට පෙර හමුදා ග්‍රහණයෙන් නිදහස් කරන ලද මුලතිවු හි පිලකුඩිඉරුප්පු ගම්මානයට යාමේ දී, ඔහුව සිවිල් ඇඳුමෙන් සිටි ගුවන් හමුදා නිලධාරීන් දෙදෙනෙකු විසින් ප්‍රශ්න කරන ලදී.[9]. ප්‍රනාන්දු ගම් වැසියන් සමග කතා කරමින් සිටින විට පුද්ගලයන් දෙදෙනෙක් එතැනට පැමිණ ඔහු කවරෙක් ද, ඔහු මෙහි පැමිණියේ කුමක් නිසා ද යන්න විමසා ඇත. මේ පුද්ගලයන් පසුව පැවසුවේ ඔවුන් ඒ අසල ඇති ගුවන් හමුදා කඳවුරෙන් බවයි. මේ ගම වසර 8ක පමණ කාලයක් ගුවන් හමුදාව විසින් ග්‍රහණයට ගෙන තිබූ අතර, මෙය නිදහස් කරන ලද්දේ දිවා රෑ තිස්සේ අඛණ්ඩව මාසයක් පුරා ගෙන ගිය විරෝධතාවයකට පසුවය. ප්‍රනාන්දු ඔවුන්ගේ

[8] http://groundviews.org/2017/03/10/spiraling-incidents-of-military-intimidation-in-the-north-ruki-fernando/

[9] http://groundviews.org/2017/03/10/spiraling-incidents-of-military-intimidation-in-the-north-ruki-fernando/

විරෝධතාවයට කිහිප වරක්ම පැමිණ ඇති අතර, විරෝධතාවයට සහාය පළ කරමින් මාධ්‍යයට කතා කර, සහ ලියා ඇත.

### **8.** *නැගෙනහිර පළාතේ ක්‍රියාකාරිකයකුට සිදු කළ අවේක්ෂණය, බිය ගැන්වීම සහ ලිංගික අඩන්තේට්ටම්*

2017 වසරේ පසු භාගයේ, රජය විවේචනය කරන ලද කතාවක් පැවැත්වීමෙන් පසුව මානව හිමිකම් ක්‍රියාකාරිකයකු සිය නිවසට ආපසු යමින් සිටියේය. මේ ක්‍රියාකාරිකයා වෙතට සිවිල් ඇඳුමෙන් පැමිණි පුද්ගලයකු තමන් පොලීසියේ යැයි පවසමින් ඔහුගෙන් ප්‍රශ්න කර සිටියේය. ඔහුගේ බෑගයේ තිබූ දේවල් පෙන්වන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ, ක්‍රියාකාරිකයා විසින් අනික් පුද්ගලයාගේ හැඳුනුම්පත දකින තෙක් එසේ කළ නොහැකි බව කියා සිට ඇත. ඉන්පසු ඔහුව වහා අනෙක් නිලධාරීන් විසින් වට කර ඇත. ඔහුව හිරිහැරයට භාජනය කිරීමෙන් අනතුරුව, සිවිල් ඇඳුමෙන් සිටි නිලධාරීන් තමන් සමග ඇවිද එන ලෙස ඔහුට බල කර ඇත. ක්‍රියාකාරිකයා විසින් තමන්ගේ ජංගම දුරකථනය භාවිතා කිරීමට උත්සාහ කර ඇතත්, වහා එය ඔහුගෙන් උදුරා ගෙන ඇත. අවසානයේ ඔහුව පාළු ස්ථානයක තිබූ පඩි පෙළක් වෙත රැගෙන ගොස් ඇති අතර, ඔහුගේ බෑගයේ තිබූ දේවල් නිලධාරීන් විසින් බිමට හිස් කර ඇත්තේ, එහි තිබූ ඇතැම් භාණ්ඩවලට හානි වෙන ආකාරයටය. නිලධාරීන් ඔහුට සැර පරුෂ භාෂාවෙන් කතා කර, ඔහුට පහර දී, පසුව ඔහුගේ සිරුර සෙවීමට ලක් කර ඇති අතර, ඒ අවස්ථාවේ නිලධාරීන් ඔහුගේ ලිංගේන්ද්‍රිය අතපත ගෑ බවටත් ක්‍රියාකාරිකයා චෝදනා කරයි. ප

මේ සිද්ධිය බරපතල මට්ටමින් අවේක්ෂණය, බිය ගැන්වීම, ලිංගික ප්‍රචණ්ඩත්වය යොදා ගනිමින් පොලීසිය විසින් ප්‍රාදේශීය ක්‍රියාකාරීන් තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කිරීමෙන් වැළැක්වීමට, තර්ජනය කිරීමට සහ නිහඬ කිරීමට යොදා ගත් අවස්ථාවකි. මේ සිද්ධිය පසුගිය රෙජීමය යටතේ සිදු වූ බොහෝ සමාන සිද්ධීන් මතක් කරන එකක් වෙන අතර, එවැනි සිද්ධි උතුර සහ නැගෙනහිර පැවැතුනු භීතිය සහ මර්දනයේ පරිසරයට දායකත්වය සැපයීය.

### ***9.*** *උතුරේ ක්‍රියාකාරිකයකු අවේක්ෂණය*

2017 වසරේ මාර්තු - අප්‍රේල් මාසවල, මන්නාරමේ මුල්ලිකුලම් පදිංචිකරුවෝ විරෝධතාවයක් කරමින් ඉල්ලා සිටියේ හමුදාව ග්‍රහණයට ගෙන ඇති තම ඉඩම් නිදහස් කරන ලෙසයි. මේ විරෝධතාවය පටන් ගත් දින සිටම, මිලිටරි අවේක්ෂණයට ලක් වූ අතර, හමුදාව විසින් විරෝධතාකරුවන්ගේ ද එයට පැමිණෙන අමුත්තන්ගේ ද ඡායාරූප ගන්නා ලදී. අවතැන් වුවන්ගේ ගම්මානයට ලබා දෙන මූලික සේවා කපා හරින බවට නාවික හමුදාව විසින් තර්ජන කිරීමෙන් පසුව, එක් ක්‍රියාකාරිකයෙක් ඒ ගැන මානව හිමිකම් කොමිසමට පැමිණිලි කළේය. මානව හිමිකම් කොමිසමේ කොළඹ ප්‍රධාන කාර්යාලයටත්, වවුනියාව කලාපීය කාර්යාලයටත් ක්‍රියාකාරිකයා විසින් නාවික හමුදාව විසින් ඡායාරූපගත කිරීම, අතවශ්‍ය සේවා කපාහරින බවට කළ තර්ජන සහ විරෝධතාකරුවන් ඉදිරිපිටින් බාධා ඇති වෙන සේ ශබ්ද නගමින් රිය පැදවීම ගැන මෙසේ පැමිණිලි කරන ලදී.

මේ පැමිණිල්ලට පසුව මාස ගණනක් තිස්සේ තමන්ට මුහුණ පෑමට වූ නිරන්තර ආරක්ෂක අවේක්ෂණය ගැන ක්‍රියාකාරිකයා විසින් වාර්තා කර ඇත.

මේ ක්‍රියාකාරිකයා විසින්ම ඡායාරූපකරණයට ලක් වීම, ඔහු සහ වෙනත් විරෝධතාකරුවන් ප්‍රශ්න කිරීමට ලක් වීම ආදියට ඉරණෛයිමතානගර් හි නාවික හමුදාව ග්‍රහණයේ ඇති ඉඩම් නිදහස් කරන ලෙසට මැයි පළමු වැනිදා සිට ආරම්භා කළ අඛණ්ඩ විරෝධතාවයක දී ද අත් විඳ ඇත.

වසරේ පසුව භාගයේ, එම ක්‍රියාකාරිකයා විසින්ම ප්‍රසිද්ධ උත්සවයක් පැවැත්වීමට රජයේ පොදු ශාලාවක් වෙන් කර ගැනීමේ දී ඔහුගේ ජංගම දුරකථන අංකය සැපයුවේය. ඔහුට පසුව එම වෙන් කිරීම් භාර නිලධාරියා විසින් කියා ඇත්තේ මිලිටරි බුද්ධි අංශ විසින් ඔහුගේ විස්තර ඉල්ලූ බවත්, එම නිලධාරියා එම තොරතුරු

ලබා දුන් බවත්ය. මේ සිද්ධිය වූ දිනයේ දී, බුද්ධි අංශ නිලධාරීන් දෙදෙනෙකු විසින් එම ස්ථානය පිරිසිදු කරමින් සිටි සේවකයන් එම උත්සවය සංවිධානය කරන සංවිධාකයන්ගේ වැඩි විස්තර සඳහා ප්‍රශ්න කර ඇත. එසේම උත්සවය පැවැත්වෙද්දී බුද්ධි අංශ නිලධාරීන් 10-15ක් පමණ එතැනට පැමිණ ඇති අතර, සහභාගිකයන්ට ඒ නිසා තමන්ගේ අදහස් නිදහසේ ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබී නැත.

## 10. *ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාන්තා ජාලය වැටලීම*



*කාන්තා ක්‍රියාකාරීන් සහ කාන්තා සංවිධාන මේ සිද්ධිය හෙළා දකිමින් විරෝධතාවයක් සංවිධානය කළහ. ජුනි, 2017. ඡායාරූපය – වැමිල් ගාඩියන්*

ජුනි 25 වැනි දා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාන්තා ජාලයේ කාර්යාලය වටලා, එතුළට බලෙන් ඇතුළු වී ඇත[10]. මේ වැටලීම සිදු කර ඇත්තේ නිර්නාමික පුද්ගලයන් විසින් වෙන අතර, මේ අය විසින් පරිගණක හා ලැප්ටොප් කිහිපයකට හානි සිදු කර ඇත. ඊට අමතරව පරිගණක දෘඩ තැටියක් සහ සංවිධානයට අයිත් යතුරු පැදියක් එදින රාත්‍රියේම සොරකම් කර ඇත.

මේ වැටලීම සිදු වෙන කාලයේ, මේ සංවිධානය විසින් මුතූර් නගරයට ආසන්නයේ පාසැල් යන වයසේ ගැහැණු ළමයි තිදෙනෙක් දූෂණය වී යැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් වැඩ කර ඇත[11] [12]. මේ සිද්ධිය නිසා දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර ආතතියන් ඇවිලී ඇත්තේ, වින්දිතයන් දෙමළ අය වීමත්, වැරැදිකරුවන් මුස්ලිම් අය වීමත් නිසාය. බලධාරීන් විසින් තවමත් කිසිවකු මේ වැටලීමේ සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන හෝ  මේ ගැන වගකිවයුතු කිසිවෙක් හඳුනා ගෙන නැත. මේ සිද්ධිය

---

[10] https://twitter.com/rukitweets/status/879264139146874880
[11] https://twitter.com/Mari_deSilva/status/879240394864603136
[12] https://www.colombotelegraph.com/index.php/wan-wants-justice-for-sexually-abused-children-calls-for-due-process-and-justice-over-politics/

මානව හිමිකම් ක්‍රියාධරයන් විසින් මුහුණ පාන බාධා, විශේෂයෙන්ම කාන්තා ක්‍රියාකාරීන් මුහුණ පාන ගැටළු සම්බන්ධ උදාහරණයකි.

## 11. *මඩකලපුවේ කාන්තා සංවිධානයකට පොලිස් සහ මිලිටරි හිරිහැර*

2017 මාර්තු මාසයේ, මඩකලපුවේ යුද්ධයේ බලපෑමට ලක් වූ කාන්තාවන් සම්බන්ධ සංවිධානයක් විසින් විරෝධතාවයක් සංවිධාන කළ අතර, එයට පොලිස් සහ බුද්ධි අංශ නිලධාරීන් පැමිණ, එම විරෝධතාවයට සහභාගි වූ ක්‍රියාකාරීන්ගේ ඡායාරූප ගන්නා ලදී. එදිනම මේ කාන්තා සංවිධානයට අයත් වාහනයක් පසු පසින් දිගින් දිගටම යතුරු පැදිවල නැගුණු පුද්ගලයන් පිරිසක් ගමන් කර ඇත.

සති කිහිපයට පසුව, ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ නිලධාරීන් දෙදෙනෙක් මේ සංවිධානයට පැමිණ, එම සංවිධානයේ ද, එහි සිටින සියලු කාර්ය මණ්ඩලයේ ද විස්තර ඉල්ලා ඇත. මේ මොහොතේ කාර්යාලයේ සිටි කාන්තාවන් විසින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති අතර, නිලධාරීන් විසින් දන්වා ඇත්තේ තොරතුරු ලෑස්ති කර තබා ගන්නා ලෙසත්, තමන් පසු දින පැමිණෙන බවත්ය.

මේ නිලධාරීන් දෙදෙනා සති අන්තයක මේ සංවිධානයට නැවත පැමිණ ඇති අතර, ඒ අවස්ථාවේ කාර්යාලය වසා තිබී ඇත. එබැවින් ඔවුහු ග්‍රාම නිලධාරි සහ ප්‍රදේශයේ පැවැති වෙනත් රජයේ කාර්යාලවලට ගොස් මේ සංවිධානය ගැන වැඩිදුර විස්තර විමසා ඇත. ඊට අමතරව හමුදා බුද්ධි අංශ විසින් සංවිධානයේ වැඩ කරන එක් කාන්තා ක්‍රියාකාරිනියකගේ නිවසට උදෑසනක ගොස් ඇත. මේ වන විට ඇය රාජකාරි සඳහා නිවසින් පිටත්ව තිබූ අතර, මේ නිලධාරීන් ඇගේ පවුලේ අයගෙන් ඇගේ ජංගම දුරකථනය ලබා ගෙන ඇගේ විස්තර ඇසීමට දුරකථන ඇමතුම් 7කට වඩා වැඩි ගණනක් ලබා දුන්හ. අවසානයේ නිලධාරීන් ඇගෙන් ඉල්ලා සිටියේ පසු දින හවස හමුදා මුරපොළක් වෙත පැමිණෙන ලෙසයි.

ඇයට සහ පවුලේ අයට තවත් කරදර වෙතැයි බය වූ ඇය, මේ මුරපොල වෙත පැමිණීමට එකඟ වූ අතර, එහිදී ඇගේ රාජකාරි ගැන ඇගෙන් ප්‍රශ්න කරන ලැබුනි. මේ හේතුවෙන් වඩාත් බියට සහ කලබලයට පත් මේ කාන්තාව අවසානයේ තීරණය කළේ සංවිධානයේ තමා කළ රැකියාවෙන් අස් වීමටයි.

මේ සිද්ධියෙන් පැහැදිලිව පෙනෙන්නේ පොලීසිය සහ හමුදාව ක්‍රියාකාරීන්ට විශේෂයෙන්ම කාන්තා ක්‍රියාකාරීන්ට හිරිහැර කරන ස්වභාවයයි. මේ අවස්ථාවේ දී සිදු කරන ලද කරදර කොයි තරම් තද බල ලෙස දැනුනේ ද, බිය ගන්වන සුළු වූයේ ද කියත හොත්, ක්‍රියාකාරිනියට ඇගේ ක්‍රියාකාරීත්වය නවතා දමා ඇය සහ පවුලේ අයගේ සාමය සහතික කිරීම සඳහා ගෙදර නැවතීමට සිදු විය. මේවා තනි පුද්ගල මට්ටමින් දුක් ගෙන දෙන කාරණා වෙනවා සේම, වඩා පුළුල් මට්ටමකින් පෙනෙන්නේ ක්‍රමානුකූල අවේක්ෂණය සහ හිරිහැර යොදා ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතයක් සඳහා වැදගත් වන මානව හිමිකම් ක්‍රියාකාරීත්වය සහ සිවිල් සමාජයේ ක්‍රියාකාරීත්වය පිරිහීමකට ලක් කරන ආකාරයයි.

## 12. *ත්‍රස්තවාදී විමර්ශන ඒකකය මන්නාරම සිවිල් සමාජ නායකයා කැඳවයි*

වී. එස්. සිවාකරන් මන්නාරමේ ප්‍රජා සංවිධාන එකමුතුවේ ප්‍රධානියා ය. ඔහු විසින් ඓතිහාසික තිරුකේතීස්වරම් කෝවිල පෙනෙන මානයේ, බෞද්ධයන් නැති ප්‍රදේශයක් ඉදි කෙරෙන නීති විරෝධී ලෙස ඉදි කරන ලදැයි කියන බෞද්ධ විහාරස්ථානයක් ජනාධිපති සිරිසේන මහතා විසින් විවෘත කිරීමට පැමිණීමට පෙර ඒ සම්බන්ධයෙන් ජනාධිපතිට ලිපියක් ඔහු විසින් ලියා ඇත[13]. ඔහුගේ ලිපියේ, සිවාකරන් ජනාධිපතිගේ සහභාගිත්වය විවේචන කළ අතර, අක්කර 10ක් විශාල පෞද්ගලික ඉඩමක කරන ලද නීති විරෝධී ඉදි කිරීමක් ලෙස එය නම් කළේය. එසේම ඔහු සඳහන් කළේ ජනාධිපති සිරිසේන මේ විවෘත කිරීමේ උත්සවයට පැමිණෙතොත්, පීඩාවට පත් ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවයන් ද ඒ හා සමගාමීව සංවිධානය වෙනු ඇති බවයි. සිවාකරන් ජනාධිපති හට කිසිදු නිශ්චිත තර්ජනයක් කරන ලද්දේ නැති අතර, එහු සඳහන් කළේ ඔහුට

[13] http://www.tamilguardian.com/content/mannar-civil-society-slam-sri-lankan-presidents-plan-attend-opening-illegally-constructed

සහ ඔහුගේ ප්‍රජාවට එක් රැස්වී විරෝධතාවය දැක්වීමට ඇති අයිතිය සම්බන්ධයෙන් පමණක් වුවත්, ත්‍රස්තවාදී විමර්ශන ඒකකය විසින් ඔහුට දන්වා සිටියේ සැප්තැම්බර් 29 වැනි දින ජනාධිපතිගේ පැමිණීමෙන් දින කිහිපයකට පසුව, ඔක්තෝම්බර් 3 වැනි දින කොළඹ කාර්යාලයේ පෙනී සිටින ලෙසයි[14]. ජනාධිපති මේ විවෘත කිරීමේ උත්සවයට කිසිසේත්ම නොපැමිණි අතර, සිවාකරන් ත්‍රස්තවාදී විමර්ශන ඒකකයට දැනුම් දුන්නේ තමන්ගේ අසනීප තත්වය හේතුවෙන් තමන්ට කොළඹ පැමිණීමට නොහැකි බවයි[15]. කෙසේ වුවත් ඔක්තෝම්බර් 20 වැනි දින නැවතත් ත්‍රස්වාදී විමර්ශන ඒකකයේ පෙනී සිටින ලෙස ඔහුට දැනුම් දෙන ලදී.

මේ සිද්ධියෙන් මතු කරන පෙන්වන්නේ උතුරු නැගෙනහිර සාම්ප්‍රදායික දෙමළ ප්‍රදේශ සිංහලකරණය - බෞද්ධකරණය වීම සහ එම ප්‍රදේශවල ජීවත් වෙන අයට මේ ගැන තම විරෝධතාවය ප්‍රකාශ කිරීමට පවතින දුෂ්කරතාවයයි. විශේෂයෙන්ම මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් ඓතිහාසික ලෙස චෝදනාවට ලක් ව ඇති ත්‍රස්තවාදී විමර්ශන ඒකකයේ සම්බන්ධ වීම බිය ගන්වන සුළු කාරණයකි. පුරවැසියකු සහ ප්‍රජා නායකයකු ලෙස සිවකාරන් වැනි නායකයන්ට තමන්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් ජනාධිපති වැනි ඡන්දයෙන් පත් වෙන නියෝජිතයන් සම්බන්ධ කර ගැනීමට සහ, අවශ්‍ය විට, සාමකාමී උද්ඝෝෂණ පවත්වමින් විරෝධතා පවත්වන බවට තර්ජනය කිරීමට ද අයිතියක් ඇත.

### ii. <u>පැහැර ගැනීම්, අත්අඩංගුවට ගැනීම සහ බිය වැද්දීම</u>

ක්‍රියාකාරීන්, විපක්ෂ දේශපාලනඥයන් සහ ජනමාධ්‍යවේදීන් ආදීන් පැහැර ගැනීම, සහ අත්අඩංගුවට ගැනීම ආදිය පෙර රජයට සාපේක්ෂව අඩු වී ඇතත්, එවැනි සිද්ධි කිහිපයක් 2017 වසරේදී ද වාර්තා විය.

### 13. *කම්කරු නායකයකු පැහැර ගැනීම*

2016, දෙසැම්බර් 26 දින, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම (ජනාධිපති සිරිසේනගේ සහෝදරයා සභාපති ලෙස වැඩ කරන)ට අනුබද්ධ අතිරේක ආයතනයක් වෙන එස්එල්ටී හියුමන් කැපිටල් සොලියුෂන්ස් විසින් සේවයේ යොදවා ඇති කොන්ත්‍රාත්තු සේවකයන් 800ක් විසින් තමන්ව ස්ථිර සේවකයන් ලෙස අනුගත කර ගන්නා ලෙස ඉල්ලමින් වැඩ වර්ජනයක් ආරම්භ කරන ලදී. සේවකයන් කියන ආකාරයට ඔවුන් කරන වැඩ ද පූර්ණ කාලීන සේවකයන්ට සමාන වෙන නමුත්, තමන්ට ලැබෙන්නේ අඩු ප්‍රතිලාභ සහ අඩු ආර්ථික සුරක්ෂිතභාවයකි. විරෝධතාවය 2017 වසරේ ද අඛණ්ඩව පැවැතුනු අතර, අනෙක් කම්කරු සංගම්, ශිෂ්‍ය ව්‍යාපාර සහ වෙනත් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ සහයෝගය ද ලැබුනි.

මේ විරෝධතාවය උච්චතම අවස්ථාවේ තිබියදී, 2017 ජනවාරි 28 වැනි දා, සමස්ත ලංකා විදුලි සංදේශ සේවක සංගමයේ උප සභාපති සුජීව මංගල, රාත්‍රියේ ගෙදර යමින් සිටියදී පැහැර ගන්නා ලදී. මංගල කියන ආකාරයට ඔහුව වෑන් රථයක් විසින් លුහු බැඳ ඇති අතර, ඔවුන් අවසානයේ මංගලව පසු කර මග අවහිර කරමින් වාහනය නවත්වා ඉන් පිටතට පැමිණි මුහුණු වසා ගත් අතෙහි තුවක්කු තිබී තිදෙනෙක් ඔහුව බලෙන් වෑන් රථය තුළට පටවා ගෙන ඇත[16]. මංගලගේ අත් පිටුපසට කර බැඳ දමා, අනතුරුව ඔහුගේ හිසට බෑගයක් දමා ඇත්තේ වටපිටාවේ කිසිවක් නොපෙනෙන ලෙසයි. පැයි 3ක් පමණ ගමන් කිරීමෙන් පසුව ඔහුව කාමරයකට දමා ඇති අතර, දින 3ක් තිස්සේ හිර කගෙන තබා ගෙන ඇත. ඔහුව රඳවා තබා ගැනීමේ දී ඔහුට වද දී නැති නමුත්, මංගල කියන පරිදි පැහැර ගත් එක් පුද්ගලයකු විසින් ඔහුට විරෝධතාවයට නායකත්වය දීම නතර කරන ලෙස කියා ඇත. පසුව දෑස් බඳින ලද මංගල, පෙබරවාරි 1 වැනිදා ඉංගිරිය පාරක් අයිනේ දමා ගොස් ඇත.

[14] http://www.tamilguardian.com/content/terrorism-investigation-department-summon-mannar-civil-society-leader-over-planned-protest
[15] http://www.tamilguardian.com/content/terrorism-investigation-department-reissue-summons-mannar-civil-society-leader
[16] http://www.jdslanka.org/index.php/news-features/politics-a-current-affairs/662-armed-abductors-threaten-trade-union-leader-to-give-up-strike-action

මේ සිද්ධිය සිරිසේන-වික්‍රමසිංහ ආණ්ඩුව යටතේ, දකුණේ වෘත්තීය සමිති ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පැහැර ගැනීම් ලෙස වාර්තා වී ඇති මුල්ම සිද්ධිවලින් එකකි. මෙය විසින් බිය ගෙන දෙන පූර්වාදර්ශයක් සපයන අතර, පෙර දශකයන්හි දී ජේ.ආර්. ජයවර්ධන සහ රණසිංහ ප්‍රේමදාස ආදී එ.ජා.ප. ජනාධිපතිවරු යටතේ කම්කරු නායකයන් මුහුණ දුන් අමානුෂික මර්දනය සිහිපත් කරයි.

රජයේ පාර්ශ්වයෙන් ඇති අඩු පිළිගැනීම සහ විමර්ශනවල මඳභාවය යන්නෙන් අදහස් වන්නේ රජය යටතේ වගවීම සම්බන්ධයෙන් පැහැරගැනීම්වල වින්දිතයන් නොසලකා හැරෙන බවයි. රජය විසින් බලහාත්කාරයෙන් අතුරුදහන්වීම්වලින් සියලුම පුද්ගලයන් ආරක්ෂා කර ගැනීමේ අන්තර්ජාතික ප්‍රඥප්තිය දේශීය වශයෙන් නීති ගත කර ඇතත්, අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පිහිටවූවත්, මේ සිද්ධිය විසින් බලහත්කාරයෙන් සිදුවන අතුරුදහන්වීම් පැරදවීමට රජයේ කැපවීම සම්බන්ධයෙන් සැක සංකා මතු කරයි.

### *14. ශිෂ්‍ය ක්‍රියාකාරිකයා පැහැර ගැනීමට උත්සාහ කිරීම*

ජූලි 21 වැනි දා, සිවිල් ඇඳුමෙන් සැරසුනු පොලිස් නිලධාරීන් වෛද්‍ය ශිෂ්‍ය ක්‍රියා කමිටුවේ කැඳවුම්කරු රයන් ජයලත් පැහැර ගැනීමට සහ අත්අඩංගුවට උත්සාහ කළේ සුදු වෑන් රථයකිනි[17]. ජයලත් සහ අනෙකුත් ශිෂ්‍යයන් විසින් වෘත්තීය සංගම් පිළබඳ සංවිධානයේ ගොඩනැගිල්ල ඉදිරිපිට දී, තාක්ෂණය සහ ඖෂධ පිළිබඳ දකුණු ආසියානු අධ්‍යාපන ආයතනය (සයිටම්) නමැති පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට විරුද්ධව විරෝධතාවයේ යෙදෙමින් පත්‍රිකා බෙදමින් සිටිය දී මේ සිද්ධිය සිදු විය. සිවිල් ඇඳුමෙන් සිටි පොලිස් නිලධාරීන් ඔහුව බලයෙන් වෑන් රියකට පටවා ගැනීමට උත්සාහ කළ අවස්ථාවේ ජයලත් යන්තමින් බේරුනි.




*තැත්කළ පැහැරගැනීම සඳහා යොදා ගත් වෑන් රථය. ඡායාරූපය - ශ්‍රී ලංකා මිරර්*

සිද්ධියෙන් පසුව කොළඹ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට ශිෂ්‍ය විරෝධතා ඇති විය[18]. අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට මේ සිද්ධිය ගැන පෙත්සමක්

[17] http://www.sundaytimes.lk/article/1028077/protest-over-alleged-attempt-to-abduct-student-leader
[18] http://www.sundaytimes.lk/article/1028077/protest-over-alleged-attempt-to-abduct-student-leader

ඉදිරිපත් කළ අතර, ජාතික කම්කරු සංගම් මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල් කාන්ත පොලිස් නිලධාරීන්ගේ මේ චර්යාව හෙළා දුටුවේය[19].

සුජීව මංගලගේ පැහැර ගැනීමේදී මෙන් නොව, මේ සිද්ධියේ දී මැති ඇමැතිවරු ඇතුළුව ඉහළ නිලතල දරන රජයේ නිලධාරීන් මේ ගැන ප්‍රකාශ නිකුත් කරන ලදී. ආර්ථික සහ ජනමාධ්‍ය ඇමැති මංගල සමරවීර මෙම තැත්කළ පැහැර ගැනීම හෙළා දුටු අතර, පොලිස්පති පූජිත් ජයසුන්දර හට මේ සිද්ධිය ගැන පරීක්ෂණයක් කිරීමට ද අණ කළේය[20]. කෙසේ වුවත්, සමරවීර මේ සිද්ධියේ දී රජයේ සම්බන්ධය ප්‍රකාශ කිරීමෙන් වැළැකුණු අතර, ඒ වෙනුවට ජාතික රජයට "කැළැලක් ඇති කිරීමට" සිදු කරන ලද "කුමන්ත්‍රණයක් ලෙස" මෙය හඳුන්වන ලදී. පාර්ලිමේන්තු මන්ත්‍රී ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මර්දනකාරී උපාය මාර්ග යොදා ගන්නා බවට රජයට චෝදනා කළ අතර, එජාප මහ ලේකම් කබීර් හෂීම් මහතා ද නීති රාමුවට පිටින් වැඩ කිරීම සම්බන්ධයෙන් පොලීසිය හෙළා දුටුවේය.

### 15. *ශිෂ්‍ය ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගැනීම*

2017 වර්ෂයේ පුළුල් ලෙසම වාර්තා කළ විරෝධතාවය ලෙස සැලකිය හැක්කේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විසින් සිදු කළ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී (සයිටම්) විරෝධතාවයයි. කොළඹ සංවිධානය කළ මේ විරෝධතා බොහෝ විට සාමකාමී ලෙස සිදු කළ අතර, පොලීසියෙන් කඳුළු ගෑස්, අධි පීඩන ජල ප්‍රහාර, වැළැක්වීමේ උසාවි නියෝග ඇතුළු අත්‍යන්ත බලය යොදවා නිතර පාලනය කරනු ලැබිනි. බොහෝ අවස්ථාවලදී ශිෂ්‍ය ක්‍රියාකාරීන් සහ විරෝධතාකරුවන් අත් අඩංගුවට ගනු ලැබිනි.

පහත දැක්වෙන්නේ සයිටම් විරෝධී පෙලපාලිවල මාධ්‍යවල වාර්තා වූ අසම්පූර්ණ අත්අඩංගුවට ගැනීම් ලැයිස්තුවකි:

- පෙබරවාරි 2 වැනිදා, ශිෂ්‍යයන් 21 ක් අත්අඩංගුවට ගත්තේ උසාවි නියෝගයකට අකීකරු වෙමින් විරෝධතාවයේ නියැලීම නිසාය. මේ විරෝධතාවය ලෝටස් වටරවුමේ පැවැත්වුනු අතර කඳුළු ගෑස් හා ජල ප්‍රහාර යොදා ගනිමින් විසිරුවනු ලැබිනි[21].

- පෙබරවාරි 15 වැනි දා, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු ලහිරු වීරසේකර සහ අන්තර් විශ්ව විද්‍යාල භික්ෂු බලමණ්ඩලයේ කැඳවුම්කරු ටැම්පිටියේ සුගතානන්ද අත් අඩංගුවට ගැනුනේ උසාවි නියෝග කඩ කිරීම සහ විරෝධතාවයක් අතරතුර මාර්ග අවහිර කිරීම නිසාය[22]

- මැයි 17 වැනිදා, බෞද්ධ භික්ෂුවක් ඇතුළු ශිෂ්‍යයන් 8 දෙනෙක් අත්අඩංගුවට ගැනුනේ විරෝධතාවය අතරතුර නීති විරෝධී හැසිරීම සහ උසාවි නියෝගයට අවනත නොවීම යන චෝදනා යටතේය[23]. අනෙකුත් වාර්තා දක්වන්නේ අඩුම වශයෙන් ශිෂ්‍යයන් 17 දෙනෙකු කඳුළු ගෑස්වලින් සහ කැරලි මර්දන පොලීසිය විසින් කළ පහර දීම්වලින් තුවාල වී ඇත[24].

[19] http://www.hirunews.lk/166456/two-ministers-accuse-police-for-their-attempt-to-abduct-convener-medical-faculty-student-activists
[20] http://www.asianmirror.lk/news/item/24591-mangala-says-white-van-abduction-a-conspiracy-promises-police-action
[21] http://www.dailymirror.lk/123190/-Update-students-arrested-over-protest
[22] http://www.adaderana.lk/news/45968/lahiru-weerasekara-and-ven-tampitiye-sugatananda-thera-remanded-
[23] http://www.hirunews.lk/161563/eight-university-students-saitm-protest-arrested-five-policemen-hospitalized
[24] http://colombogazette.com/2017/05/17/police-fire-tear-gas-to-disperse-anti-saitm-protest/

❖ ජුනි 21 වැනි දින, සිය ගණනක ශිෂ්‍ය විරෝධතාකරුවන් විරෝධතාවයේ කොටසක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට පැමිණ එහි නතර වූහ. විශේෂ කාර්ය බලකාය ඇතුළුව කැරලි මර්දන පොලීසිය මෙහිදී යෙදූ අතර, බැටන් පොලුවලින් පහර දී, කඳුළු ගෑස් ගසා ශිෂ්‍යයන් පලවා හරිනු ලැබුනි. ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍යයන් 84-96 අතර පිරිසකට තුවාල වූ අතර, ඔවුන් සියල්ල ජාතික රෝහලට ඇතුළත් කරන ලදී[25] [26]. අඩුම ගණනේ ශිෂ්‍යයන් දෙදෙනෙක් අත්අඩංගුවට ගන්නා ලදී.

❖ ජුනි 23 වැනි දා, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍යබලමණ්ඩලයේ කැඳවුම්කරු ලහිරු වීරසේකර, සහ අන්තර් විශ්ව විද්‍යාල භික්ෂු බලමණ්ඩලයේ කැඳවුම්කරු වැම්පිටියේ සුගතානන්ද හිමි සහ ශිෂ්‍ය ක්‍රියාකාරී ෆයිස්දීන් ෆයිසාන් මොහොමඩ් ජුනි 21 වැනි දා අමාත්‍යාංශයට බලෙන් ඇතුළු වීම සංවිධානය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා ලදී[27].

❖ ඔක්තෝම්බර් 12 වැනිදා, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍යබලමණ්ඩලයේ කැඳවුම්කරු ලහිරු වීරසේකර සහ බෞද්ධ භික්ෂුවක් ඔක්තෝම්බර් 10 වැනි දා පැවැති විරෝධතාවයක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා ලදී [28].

### iii. <u>විරෝධතාවයන්ට සීමා සහ ප්‍රහාර</u>

**16.** *උසාවි නියෝග*

විසම්මුතිය මර්දනය කිරීමේ ප්‍රකට ක්‍රම 2017 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, අවේක්ෂණය, තර්ජන, බිය ගැන්වීම, අත්අඩංගුවට ගැනීම, පැහැර ගැනීම් සහ එවැනි දෑ යොදා ගනිද්දී, රජය වැඩි වශයෙන් උසාවි නියෝග වැනි නීති ක්‍රමවේදයන් යොදා ගනිමින් මානව හිමිකම් ක්‍රියාකාරීත්වය මැඩලීමට උත්සාහ කරන ලදී.

සිද්ධි කිහිපයක දී, උතුරේ සහ දකුණේ දෙකෙහි දීම, උසාවි නියෝග යොදා ගෙන මිනිසුන් ගේ එක්රැස්වීමේ සහ විරෝධතා දැක්වීමේ අයිතිය උදුරා ගනු ලැබුවේ එම විරෝධතා මහජනතාවට කරදරයක් යන ව්‍යාජ හේතුව යොදා ගනිමිනි. මේ නියෝග කඩ කරන විරෝධතාකරුවන්ට එරෙහිව අධික පොලිස් බලය යෙදවූ අතර කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කරන ලදී. විශ්ව විද්‍යාල සිසුන් මෙහෙය වූ සයිටම් විරෝධතාවය වැනි සමහරක් අරගලවලදී, ශිෂ්‍ය ක්‍රියාකාරීන් සහ සංවිධායකයන් අත්අඩංගුවට යොදා ගත් ප්‍රධාන ව්‍යාජ හේතුවක් වූයේ උසාවි නියෝග කඩ කිරීම බැව් පෙනේ. මේ කොටසේ බොහෝ සිද්ධි විසින් මතුකර දක්වන්නේ ශිෂ්‍ය ක්‍රියාකාරීන්ගේ අත්අඩංගුවට ගැනීම් ය.

මැයි 17 වැනි දා, මුලතිවු හි, පොලීසිය විසින් උසාවි නියෝගයක් ලබා ගත්තේ කතෝලික පියතුමා විසින් ප්‍රජා යුද ස්මාරක සැමරුමක් සංවිධානය කිරීම වැළැක්වීමටය. උසාවි නියෝගය පසුව අභියෝගයට ලක් කර, යන්තමින් සංශෝධනය කළත්, එම ක්‍රියාව විසින් සංවිධාකයන් බිය ගැන්වීමත්, හිරිහැර කිරීමත් සිදු කරන ලදී.

---

[25] http://www.sundaytimes.lk/article/1024057/84-students-injured-as-police-fire-tear-gas-baton-charged-at-health-ministry
[26] http://www.dailynews.lk/2017/06/27/local/120175/storming-health-ministry-two-more-suspects-arrested
[27] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=167154
[28] http://colombogazette.com/2017/10/12/iusf-convener-arrested-and-remanded-over-protest/

## 17. *කඳුළු ගෑස්, ජල ප්‍රහාර සහ පහර දීම්*

2017 වසර පුරා නිතර විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විසින් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට විරුද්ධව සුවිසල් විරෝධතා සංවිධානය කරන ලදී. මෙවැනි බොහෝ විරෝධතාවලට මාධ්‍යයේ වාර්තාවූ අන්දමට චෝදනා කරන ලද්දේ මාර්ග තදබදය ඇති කිරීමත්, මහජනතාවට කරදරකාරී ලෙස හැසිරීමත්ය. පොලීසිය ඊට ප්‍රතිචාර වශයෙන් අධික ලෙස, කඳුළු ගෑස්, ජල ප්‍රහාර සහ කායික ලෙස පහර දීම තුළින් විරෝධතාකරුවන් හැසිරවීම සහ විසුරුවා හැරීම සිදු කරන ලදී.



*පොලීසිය විසින් කොළඹ, විහාරමහා දේවි උද්‍යානය ඇතුළත විරෝධතාවයේ යෙදෙන අන්තර් විශ්වවිද්‍යාල බලමණ්ඩලයේ සාමාජිකයන්ට කඳුළු ගෑස් එල්ල කරන අයුරු. ඡායාරූපය දමිත් වික්‍රමසිංහ (ඩේලි මිරර්)*

පහත දැක්වෙන්නේ මාධ්‍ය විසින් වාර්තා කළ අත්‍යන්ත පොලිස් බලය යෙදවූ සිද්ධීන්ගේ ලැයිස්තුවකි:

- ජනවාරි 19 වැනිදා, පොලිසිය කොල්ලුපිටියේ ශිෂ්‍ය විරෝධතාකරුවන්ට එරෙහිව කඳුළු ගෑස් එල්ල කරන ලදී.[29].

- පෙබරවාරි 1 වැනිදා, පොලසිසිය ජාතික වෙළෙඳ සංගම් මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද විරෝධතාවයකට කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කරන ලදී[30]. උසාවි නියෝගයක් අතැතිව සිටි පොලීසිය විසින් විරෝධතාකරුවන් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ළගා වීම වැළැක්වීමට උත්සාහ කරන ලදී. කෙසේවුවත් බාධක බිඳ ගෙන විරෝධතාකරුවන් ගමන් කිරීමට උත්සාහ කළ අතර, මෙහිදී පොලීසිය විසින් ජලප්‍රහාර සහ කඳුළු ගෑස් යොදා ගන්නා ලදී.

- පෙබරවාරි 2 වැනිදා, වෛද්‍ය පීය ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව කොළඹ වෛද්‍ය පීයයේ සිට ජනාධිපති කාර්යාලය දක්වා විරෝධතාවයක් සිදු කළේ මහජන රැස්වීම් සහ මහජනතාවට හිරිහැර වෙන නිසා එම විරෝධතාවය වළකමින් උසාවි නියෝගයක් තිබියදීය[31]. පොලීසිය විසින් විරෝධතාකරුවන් විසිරුවීමට කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර යොදා ගන්නා ලදී.

[29] https://www.newsfirst.lk/2017/01/160101/
[30] https://www.newsfirst.lk/2017/02/police-use-water-cannons-tear-gas/
[31] https://www.newsfirst.lk/2017/02/police-fire-tear-gas-water-cannons-disperse-protest-medical-students/




*ශිෂ්‍ය විරෝධතාකරුවන්ට පහර දීමට පොලිස් නිලධාරීන් යකඩ පොලු සහිතව. ඡායාරූපය පුබුදු ජාගොඩ (කලම්බු ටෙලිග්‍රාෆ්)*

- මාර්තු 13 වැනිදා, අන්තර් විශ්ව විද්‍යාල බලමණ්ඩලය විසින් සංවිධානය කළ විරෝධතාවයකට ලෝටස් වටරවුමේ දී පොලීසිය විසින් කඳුළු ගෑස් සහ ජලප්‍රහාර එල්ල කරන ලදී[32].

- මැයි 18 වැනිදා, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය විසින් කොටුව දුම්රියපලේ සිට විශ්ව විද්‍යාල කොමිෂන් සභාව වෙත විරෝධතා රැළියක් සිදු කළේ ද උසාවි නියෝගයකට අවනත නොවෙමිනි[33]. පොලීසිය විසින් ශිෂ්‍යයන් වළකන ලද අතර, අවසානයේ ඔවුන්ට කඳුළු ගෑස් ගසා විසිරුවීමට උත්සාහ කරන ලදී. මෙහිදී ශිෂ්‍යයන් කිහිප දෙනෙක් තුවාල වී කොළඹ මහරෝහලට ඇතුළත් කරන ලදී.

- මැයි 24 වැනිදා, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සහ ඔවුන්ගේ දෙමාපියන් විසින් කොටුව දුම්රියපොලේ සිට ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා විරෝධතා පෙළපාළියක් සංවිධානය කරන ලදී[34]. මේ පෙලපාලියට පොලීසිය විසින් ලෝටස් වටරවුමේ දී බාධා කළ අතර, කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර යොදා ගනිමින් පිරිස විසුරුවා හරින ලදී. තුවාල වූවන් අතර ශිෂ්‍යයන්, දෙමාපියන් සහ එක් ජන මාධ්‍යවේදියෙක් සිටියහ.

- ජුනි 21 වැනිදා, ශිෂ්‍ය විරෝධතාකරුවන් සිය ගණනක් ඔවුන්ගේ විරෝධතාවයේ කොටසක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට ඇතුළු වී, එහි නතර වූහ. විශේෂ කාර්ය බලකාය ඇතුළුව කැරලි මර්දන

[32] https://www.newsfirst.lk/2017/03/police-fire-tear-gas-university-students-protesting-colombo/
[33] https://www.newsfirst.lk/2017/05/tear-gas-fired-protesting-students-defied-court-orders-video/
[34] https://www.newsfirst.lk/2017/05/tear-gas-water-cannons-fired-medical-faculty-students-parents/

පොලීසිය බැටන් ප්‍රහාර සහ කඳුළු ගෑස් යොදා ගනිමින් ඔවුන් විසුරුවා හරින ලදී. මේ ගැටුමෙන් 84 -96 අතර ශිෂ්‍ය පිරිසක් තුවාල ලැබූ අතර ඔවුන් සියලු දෙනා ජාතික රෝහලට ඇතුළු කරන ලදී[35 36].

❖ ඔක්තෝම්බර් 10 වැනි දා, පොලිස් නිලධාරීන් විසින් ශිෂ්‍ය ක්‍රියාකාරීන්ට පහර දීමට යකඩ පොලු යොදා ගන්නා අයුරු ඡායාරූප ගත වී තිබුනි[37]. වාර්තාවලට අනුව අඩුම ගණනේ ශිෂ්‍යයන් 14 දෙනෙක් තුවාල නිසා ජාතික රෝහලට ඇතුළු කරන ලදී.

**iv.** <u>**මාධ්‍ය මර්දනය, විශේෂයෙන්ම දෙමළ ජනමාධ්‍යවේදීන්**</u>

කිසිදු ජනමාධ්‍යවේදියකු ඝාතනයට හෝ පැහැර ගැනීමට 2017 වර්ෂයේ දී ලක් නොවූ නමුත් (එසේම 2015-2016 දී), උතුරේ දෙමළ ජනමාධ්‍යවේදීන්ට එරෙහි තර්ජන, බිය ගැන්වීම් සහ සීමාවන් නිතර සිදුවන බව පෙනෙන්නට තිබේ. තවදුරටත් බිය ගෙන දෙන්නේ 2017 වසරේ පසු භාගයේ දී වෙබ්අඩවි වාරණය ද නැවත් පැමිණීමයි. පහත දැක්වෙන්නේ සමහරක් සිද්ධීන්ය.

***18. යාපනය ජනමාධ්‍යවේදීන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රශ්න කිරීමට ලක් කර සිංහලෙන් ලියූ ප්‍රකාශයක් අත්සන් කිරීමට කියයි***

ජූලි මාසයේ, උතුරේ දෙමළ පුවත්පත් සහ විකාශන ජනමාධ්‍යවේදී ටී. ප්‍රදීපන් හට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කිහිප වරක් නොතීසි ලැබුනේ එහි කොළඹ කාර්යාලයට පැමිණ උතුරු පළාත් සභා මන්ත්‍රී එම්.කේ. සිවාජිලිංගම් 'ජනවාර්ගික ගැටුම් ඇතිවෙන ආකාරයට[38]'' සිදු කරන ලද මාධ්‍ය සම්මන්ත්‍රණයක් විකාශනය කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා දීමටයි. ප්‍රදීපන් හට කොළඹට පැමිණෙන ලෙස පළමු වරට දැනුම් දුන්නේ ජූලි 10 වැනිදා, ඊට හුදෙක් දින 3ක් තිබියදීය. ප්‍රදීපන් ඔහු වෙත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් පණිවුඩය ගෙනා පොලීසියට ඔහු දැනුම් දුන්නේ තමන් රිය අනතුරකට ලක්ව තුවාල වී සිටින බැවින් ඔහුට කොළඹට යෑම කළ නොහැකි බවයි. ප්‍රදීපන්ට දෙවැනි වර ද නොතීසි ජූලි 12 වැනිදා ලැබුණු අතර, ඔහුව කොළඹ පිහිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ජූලි 15 වැනිදා කැඳවා තිබුනි. ඒ වෙන විටත් ඔහුගේ තුවාල සනීප වී නොතිබූ බැවින් ඔහුට ජූලි 18 වැනි දා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ප්‍රශ්න කරනු ලැබීමට යාපනය දිස්ත්‍රික්කයේ අවුවේලි පොලීසියට පැමිණෙන ලෙස දන්වා තිබුනි.

ජූලි 18 වැනි දා, මාධ්‍ය සම්මන්ත්‍රණය සම්බන්ධයෙන් ප්‍රදීපන්ගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැය 3ක් ප්‍රශ්න කරන ලද අතර, ඔහුට වීඩියෝ සාක්ෂි ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදී. ඔහු දෙමළින් ලබා දුන් ප්‍රකාශය සිංහලෙන් සටහන් කරන ලද අතර, සිංහල බස ගැන වැටහීමක් ඔහුට නැත. සිංහලෙන් ලියන ලද මේ ප්‍රකාශය අත්සන් කරන ලෙස ඔහුට බල කළේ, එහි අඩංගුව ඇත්තේ මොනවා දැයි සහතික කර දැන ගැනීමට ඔහුට ක්‍රමයක් නොතිබියදීය[39].

---

35 http://www.sundaytimes.lk/article/1024057/84-students-injured-as-police-fire-tear-gas-baton-charged-at-health-ministry
36 http://www.dailynews.lk/2017/06/27/local/120175/storming-health-ministry-two-more-suspects-arrested
37 https://www.colombotelegraph.com/index.php/police-brutality-continues-no-more-batons-now-its-iron-bars/
38 http://www.tamilguardian.com/content/tamil-journalist-issued-multiple-summons-cid-over-broadcast-press-conference
39 http://www.tamilguardian.com/content/tamil-journalist-interrogated-3-hours-cid-and-pressured-sign-statement-sinhalese

### *19. දෙමළ ගුවන් විදුලි ජනමාධ්‍යවේදියාට යාපනයේ දී කළ ප්‍රහාරය*

දෙසැම්බර් 2 වැනිදා, දෙමළ ගුවන්විදුලි ජනමාධ්‍යවේදී ශන්මුගනාදන් මනෝහරන්, චාවකච්චේරිහි පිහිටි තමන්ගේ නිවස වෙත ගමන් කරමින් සිටියදී ත්‍රිරෝද රථයක් විසින් ඔහුගේ මග අවහිර කර ඇත[40]. ත්‍රිරෝද රථයෙන් එළියට පැමිණි පුද්ගලයන් තිදෙනෙක් ඔහුට පහර දී ඇති අතර, මහ ගමන් කරන වෙනත් අය පැමිණෙද්දී පහර දුන් අය පලා ගොස් ඇත. මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් චාවකච්චේරි පොලීසියට කර ඇති අතර, වාර්තා වෙන අන්දමට ත්‍රිරෝද රථයේ රියදුරා අත්අඩංගුවට ගෙන ඇත.

### *20. මුලතිවු හි ජනමාධ්‍යවේදීන් 8 දෙනෙක් රඳවා තබා ගැනීම*

දෙසැම්බර් 9 වැනිදා, මුලතිවුහි සිංහලකරණය සම්බන්ධයෙන් කරුණු සොයමින් සිටි ජනමාධ්‍යවේදීන් 8 දෙනෙක් බයිසිකලයක ගමන් කරමින් සිටි සොල්දාදුවකු විසින් ප්‍රශ්න කළ අතර, පසුව වෙනත් සොල්දාදුවකුට දැනුම් දීමෙන් පසුව මේ කණ්ඩායම රඳවා තබා ගන්නා ලදී[41]. හැඳුනුම්පත් සැපයූ නමුත්, එය නොසලකා මේ ජනමාධ්‍යවේදීන් පැය බාගයකට වැඩි වේලාවක් රඳවා ගෙන, පසුව පොලීසිය කැඳවා ඇත. සිවිල් ඇඳුමෙන් පැමිණි පොලිස් නිලධාරීන් තමන් සම්බන්ධයෙන් කිසිදු හැඳුනුම්පතක් සැපයීම ප්‍රතික්ෂේප කරන ලදී. මේ නිලධාරීන් විසින් ජනමාධ්‍යවේදීන්ගේ කැමරා අත්අඩංගුවට ගෙන, සොල්දාදුවන්ට සැපයූ අතර, ප්‍රදේශයේ දී ලබා ගත් සියලු ඡායාරූප හා වීඩියෝ ඔහු විසින් මකා දමන ලදී. නිලධාරීන් විසින් ජනමාධ්‍යවේදීන්ගේ ඡායාරූප ගත් අතර, ඔවුන්ගේ හැඳුනුම්පත් අංක සහ වාහන ලියාපදිංචි අංක ඔවුන් පිටව යාමට ඉඩ දීමට පෙර සටහන් කර ගන්නා ලදී.

### *21. මුලතිවු හි ජනමාධ්‍යවේදියකුට කළ පහර දීම*

දෙසැම්බර් 9 වැනිදා, දමිළ ජනමාධ්‍යවේදී සුබ්‍රමනියම් බාස්කරන් හට අංක තහඩු රහිත යතුරු පැදියකින් පැමිණි තිදෙනෙක් විසින් පහර දුන්නේ මුලතිවු දිස්ත්‍රික්කයේ, මාන්කුලම් හි පණ්ඩිකුලම් ප්‍රදේශයේ දීය[42]. ප්‍රහාරකයන් විසින් පොලුවලින් බාස්කරන්ට පසුපස හඹා යමින් පහර දී ඇති අතර, ඔහුගේ හිසට සහ අත්වලට තුවාල වී ඇත. පොලීසිය පැමිණිවිට පහර දුන් අය විසිර ගොස් ඇති අතර, ප්‍රදේශවාසීන් විසින් ඉන් එක් අයෙක් අල්ලා භාර දී ඇත.

### *22. මරුතකර්නි විරෝධතාවය ආවරණය කළ ජනමාධ්‍යවේදීන්ට කළ බිය ගැන්නවීම්*

මාර්තු 21 වැනිදා, දමිළ ජනමාධ්‍යවේදීන් තිදෙනෙක් විසින් අතුරුදහන් වූවන්ගේ පවුල් විසින් යාපනය දිස්ත්‍රික්කයේ මරුතකර්නි හි දී සිදු කළ විරෝධතාවයක් ආවරණයට ගිය අවස්ථාවේ, ආවේක්ෂණයට ලක්වූ අතර, හිරිහැර කිරීමට සහ තර්ජන කිරීම්වලට ද භාජනය වූහ[43]. වාර්තාකරුවන්ට අනුව, ඔවුන් යාපනය සහ චාවකච්චේරි ප්‍රදේශවලට අයත් වූ අතර සොල්දාදුවන් විසින් ඔවුන්ගේ ඡායාරූප විරෝධතාවයට පැමිණෙද්දී ලබා ගෙන තිබුනි. ආපසු යාපනයට යද්දී, යතුරුපැදිවලින් පැමිණි සොල්දාදුවෝ ඔවුන් පසුපසින් පැමිණි අතර, කැඩුනු දෙමළින් ඔවුන්ට නවතින ලෙස කෑ ගසා පැවසූහ. නැවැත්වීමෙන් පසුව, වාර්තාකරුවන් ප්‍රශ්න කරන ලද අතර, මේ ප්‍රදේශයට පැමිණීමට අවසර අවශ්‍ය බවත් ඔවුන්ට පවසන ලදී. ඔවුන්ගේ වාහන අංක සටහන් කර ගත් අතර, කිසිම තැනක නොනැවතී ගෙවල් බලා යන ලෙස සොල්දාදුවන් විසින් ඔවුන්ට තර්ජනාත්මක ලෙස පවසන ලදී. එක් සොල්දාදුවෙක් වාර්තාකරුවන් වෙත පැමිණ පහර දීමට මෙන් හඟවා ඇත.

---

40 http://www.tamilguardian.com/content/tamil-radio-journalist-attacked-jaffna
41 http://www.tamilguardian.com/content/sri-lankan-army-detains-tamil-journalists-documenting-sinhalisation-mullaitivu
42 http://www.tamilguardian.com/content/tamil-journalist-attacked-mullaitivu
43 http://www.tamilguardian.com/content/tamil-journalists-threatened-sri-lankan-soldiers

ජුලි 18 වැනි දා, යාපනය පදනම් කර ගත් ජනමාධ්‍යවේදියකු වන උදයරාසා ශාලින් පොලීසිය විසින් නවත්වා හිරිහැරයට භාජනය කරන ඇත්තේ එම විරෝධතාවයම ආවරණය කිරීමට උත්සාහ කරද්දීය[44]. ශාලින් මගදී නවත්වන ලද සොල්දාදුවන් දෙදෙනෙකු විසින් ඔහුගෙන් යන තැන අසා, විරෝධතාවය අවසන් බැවි ඔහුට ඒත්තු ගන්වන්නට උත්සාහ කළේය. අනතුරුව සොල්දාදුවන් විසින් ඔහුගේ හැඳුනුම්පත පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔහු උතුරු නැගෙනහිර ප්‍රසිද්ධ වාර්තාකරුවකු බවට හඳුනා ගත් අතර, බොරු පතුරුවන බවට ඔහුට චෝදනා කළේය.

### *23. පොලීසිය හම්බන්තොට ජනමාධ්‍යවේදියෙකුට පහර දෙයි*



*පොලීසිය ජනමාධ්‍යවේදියාට පහර දෙමින්, ඡායාරූපය - අද දෙරණ*

ඔක්තෝම්බර් 6 වැනිදා, සහාය පොලිස් අධිකාරී රෝෂාන් දළුවත්ත ජනමාධ්‍යවේදියකු අත්අඩංගුවට ගන්නා අතර අතරතුර පහර දෙන අයුරු වීඩියෝ කර තිබුනි[45]. මේ වීඩියෝවේ දී කරුණාරත්න පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් අල්ලා ගෙන සිටින අතර, දළුවත්ත විසින් ඔහුගේ කනට පහර දෙයි. එමය අන්තර්ජාලය පුරා ප්‍රචාරය වූ අතර, රූපවාහිනී නාලිකාවල ද විකාශය කරන ලදී. මානව හිමිකම් කොමිසම මේ සම්බන්ධයෙන් කෙටි කලකින් විමර්ශනයක් ආරම්භ කරන ලදී. ජාතික පොලිස් කොමිසම ප්‍රකාශ කළේ තමන් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කිරීමට පෙර, පොලිස්පති අජිත් ජයසුන්දර මහතාගෙන් වාර්තාවක් එනතුරු බලා සිටින බවයි. කෙසේවුවත් මේ කියමන හිටපු මානව හිමිකම් කොමසාරිස්වරයකු විසින් අභියෝගයකට ලක් කරමින් කියා සිටියේ නිදහස් ආයතනයක් ලෙස ජාතික පොලිස් කොමිසම එහි පරීක්ෂකයන් යෙදවීම සිදු කළ යුත්තක් බවයි[46].

### **24. ඊ නිවුස් සහ අනෙකුත් වෙබ් අඩවි අවහිර කිරීම**

2017 නොවැම්බර් 8 වැනිදා, රජය සම්බන්ධ විවේචනාත්මක ප්‍රවෘත්ති පල කරන, මතභේදකාරී ලංකා ඊ නිවුස් පුවත් වෙබ්අඩවිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන අධිකාරිය විසින් අවහිර කරන ලදී[47]. සිවිල් සමාජ නිරීක්ෂකයන්ට අනුව මේ අවහිර කිරීම සිදුවන්නේ රජයේ ප්‍රකාශක රාජිත සේනාරත්න විසින් ජනාධිපති

[44] http://www.tamilguardian.com/content/tamil-journalist-harassed-sri-lankan-soldiers-en-route-disappearances-protest
[45] http://srilankabrief.org/2017/10/journalist-attacked-by-police-officer-in-public-hrc-sl-launch-an-investigation/
[46] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=173012
[47] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=174876

සිරිසේනගෙන් සමාජ මාධ්‍යවල ප්‍රශ්නකාරී සහ අසභ්‍ය භාෂාවෙන් යුත් අන්තර්ගතයන් පළ කරන අය අත්අඩංගුවට ගන්නා ලෙස ප්‍රකාශ කිරීමෙන් සුළු වේලාවකට පසුය[48].

ග්‍රවුන්ඩ්වීව්ස්, මාත්‍රම් සහ විකල්ප විසින් ඒ අනුව මේ අවහිර කිරීම් ගැන විස්තර දැන ගැනීමට තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම් යොමු කරන ලදී. තොරතුරුවලින් හෙළි වූයේ සිරිසේන-වික්‍රමසිංහ රජය 2015 වසරේ බලයට පැමිණීමෙන් පසුව වෙබ් අඩවි 13ක් අවහිර කර ඇති බවත් ඉන් බහුතරය දේශපාලනික වෙබ් අඩවි වෙන බවත්ය. තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම හරහා ලැබුණු අමතර ලියකියැවිලිවලට අනුව හෙළි වුන්නේ අඩුම ගණනේ වෙබ් අඩවි 4ක් සඳහා මුල් නියෝග පැමිණ ඇත්තේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් බවයිs[49]. අවහිර කිරීමට ලබා දුන් හේතු අතරට "සාවද්‍ය තොරතුරු පළ කිරීම සහ ජනාධිපතිගේ කීර්ති නාමයට හානි කිරීම" අඩංගු වේ.

ලංකා ඊ නිවුස් අවහිර කිරීම සහ තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් යටතේ හෙළිදරවු වූ කරුණු වැදගත් වන්නේ සිරිසේන-වික්‍රමසිංහ නායකත්වය දරන යහපාලන රජය යටතේ, කලින් රාජපක්ෂ රෙජීමය යටතේ භාවිතා වූ මර්දනකාරී උපායමාර්ගයක් වූ අන්තර්ජාලයේ ප්‍රවෘත්ති වෙබ් අඩවි අවහිර කිරීම ගැන වාර්තා වූ පළමු සිද්ධිය වෙන බැවිනි.

**v.** <u>**නීතිඥයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහි පලිගැනීම්**</u>

**25.** ***ආගමික සුළුතරයන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය මානව හිමිකම් නීතිඥයාට තර්ජන***




*කොළඹ සිවිල් සමාජ කණ්ඩායම් ඇමැතිවරයා විසින් කළ තර්ජනවලට විරෝධය දක්වමින්, ඡායාරූපය - විකල්ප*

මානව හිමිකම් ක්‍රියාකාරී සහ මානව හිමිකම් නීතිඥ ලක්ෂාන් ඩයස්, ජුනි 14 වැනිදා, ජාතික රූපවාහිනී නාලිකාවක දී ශ්‍රී ලංකාවේ කතෝලික නොවන ක්‍රිස්තියානි පුද්ගලයන්ට එරෙහිව දිගින් දිගටම සිදු වෙන පහර දීම් ගැන කතා කරමින් *ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානයේ වාර්තාවක් උපුටා දක්වමින් ආගමික සුළුතරයක් වන ඉවාන්ජෙලික ක්‍රිස්තියානුවන්ට එරෙහිව, ප්‍රධාන වශයෙන් ප්‍රදේශවාසීන් සහ*

---

48 http://www.cpalanka.org/on-the-blocking-of-lanka-e-news-website-in-sri-lanka/
49 https://groundviews.org/2017/12/08/blocked-rti-requests-reveal-process-behind-blocking-of-websites-in-sri-lanka/

*බෞද්ධ භික්ෂූන් ඇතුළු බෞද්ධ බහුතරයක් විසින් සිදුකළ ලේඛනගත කර ඇති පහරදීම් 195ක් සම්බන්ධයෙන් සඳහන් කළේය*[50].

එවකට අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂ ජූනි 17 වැනිදා ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශය වූ ප්‍රකාශයකින් මේ චෝදනාවලට ප්‍රතිචාර දැක් වූ අතර, ඩයස් විසින් සඳහන් කළ සංඛ්‍යා වැරැදි ලෙස උපුටා දක්වමින්, ඔහුගේ කීම පදනම් විරහිත බවත්, පැය 24ක් ඇතුළත ඔහු ජාතියෙන් සමාව නොගන්නේ නම් නීතිවේදි වෘත්තියෙන් ඔහු ඉවත් කරන බවට තර්ජනය කළේය[51]. ජනාධිපති සිරිසේන පසුව සඳහන් කළේ ඔහු කොළඹ කතෝලික අගරදගුරු මැල්කම් රංජිත් හට මේ පහර දීම් සම්බන්ධයෙන් කතා කළ බවත්, එවැනි කිසිවක් සිදු වී නැති බවත්ය. කෙසේවුවත් ඩයස් ඉදිරිපත් කළ සංඛ්‍යාලේඛන කතෝලික නොවන ක්‍රිස්තියානි අයට නිශ්චිත ඒවා විය.

නීති වෘත්තියෙන් ඉවත් කරන බවට රාජපක්ෂගේ ප්‍රසිද්ධ තර්ජනයෙන් පසුව, ඩයස් අවසානයේ ඔහුගේ පෞද්ගලික ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුනු බිය නිසා රට හැර යන්ට සිදු විය. මීට වඩා දරුණු තර්ජන තිබුන පෙර රෙජීමය යටතේ ද ඔහු මෙසේ රට හැර දමා නොගිය කෙනෙකි. දැන් ඔහු නැවත ලංකාවට පැමිණ ඇත.

මේ සිද්ධිය විසින් මතු කර දක්වන්නේ ශ්‍රී ලාංකීය දේශපාලනඥයන් විසින් ක්‍රියාකාරීන්ට තර්ජනය කිරීම හා බිය ගැන්වීම ඒකපාර්ශ්වීය සහ නොබියව සිදු කරන ආකාරය යි. ඇත්ත වශයෙන්ම ඩයස් නීතිඥ වෘත්තියෙන් ඉවත් කිරීමට අධිකරණ ඇමැතිවරයා විසින් සිදු කරන ලද තර්ජනය ඔහුට ඇති බලතලවල සීමාවෙන් පිටස්තර එකක් විය. මෙවැනි තර්ජනවල ප්‍රසිද්ධ සහ විවෘත ස්වභාවය සැලකිය යුතු කාරණයක් සේ දිගටම පවතින අතර, එවැනි බලය වැරැදි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් වගවීම ගැන රජයේ කැමැත්තත්, අවංකව විසම්මුතියේ කටහඬවල නිදහසට ඉඩ දීම සම්බන්ධයෙනුත් ප්‍රශ්න ඇති කරයි.

## 26. *මානව හිමිකම් නීතිඥයාට කළ පහර දීම*

එච්. ටී. අමිත ආරියරත්න මහතා කොළඹ දිස්ත්‍රික්කයේ රාගම පදිංචි මානව හිමිකම් නීතිඥයෙක් වෙන අතර, අවුරුදු 20ක් පමණ නීති වෘත්තියේ යෙදී ඇත. ඔහු ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයෙක් වන අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ දී නීතිඥයකු ලෙස දිවුරුම් දී ඇත්තේ 1997 වසරේදීය.

2017 ජූලි 12 වැනි දා, රාත්‍රී 9.20ට, ආරියරත්න ත්‍රිරෝද රථයකට ගොඩවූයේ අවන්හලකින් ආහාර ගැනීමෙන් අනතුරුව ගෙවල් බලා යාමටය. මේ ගමනේදී ආරියරත්න මහතාට සිහි නැති වී ඇති බැව් ඔහු කියයි. ඔහුට සිහිය එනවිට ඔහු සිටියේ වගුරු බිමකට කිට්ටුවෙන් තිබූ අත්හැර දැමූ ඉඩමකය. කැලැ හමුදා නිල ඇඳුමකින් සැරසුණු මිනිසුන් දෙදෙනෙක් ඔහු ඉදිරියේ සිටිනු ඔහු දුටුවේය. ඔහුගේ කමිසය ඉවත් කර තිබුනු අතර, ඒ වන විට ඔහු හැඳ සිටියේ බැනියම සහ කලිසම පමණි. ඔහු නැගිට ගැනීමට උත්සාහ ගනිද්දී, පසෙක සිටි දෙදෙනා ඔහුගේ මුහුණටත්, හිසටත්, සිරුරටත් පහර දුන්නේ, ඔහුට වාචිකවද තර්ජනය කරමිනි. මේ පුද්ගලයන් ආරියරත්න පැවසුවේ ඔහුව මෙතැනට ගෙනාවේ ඔහු පොලීසියට විරුද්ධව නඩුවලට පෙනී සිටින බැවින් ඔහු මරා දැමීමට බවයි. ආරියරත්න ඊළඟට දුටුවේ වාහනයක් ඒ අසල නවතා ඇති බවත් තවත් පුද්ගලයන් එහි ඇතුළත සිටින බවයි, ඒ අතර වාහනයේ සිටි කෙනෙක් "ඕකව මරපන්!" කියා හඬ ගෑවේය.

මේ අතර ආරියරත්නගේ පුද්ගලයන් ඇඳුම් ගැලවීමට උත්සාහ කළේ ඔහුට පිරිමින් හය දෙනෙකු විසින් ගුද ලිංගික සංසර්ගයේ යෙදෙන බවට තර්ජනය කරමිනි. තමන්ගේ කලිසම ගැලවීමට උත්සාහ කරද්දී

[50] http://www.thesundayleader.lk/2017/06/25/media-and-christian-organisations-raise-concerns/
[51] https://groundviews.org/2017/06/18/in-support-of-religious-minorities-rule-of-law-and-lakshan-dias/

ආරියරත්න එයට විරෝධය පෑවේය. එවිට එක් නිලධාරියෙක් තමන්ගේ පිස්තෝලය ආරියරත්න වෙතට දිගු කර "දැන් මම උඹට වෙඩි තියන්න යන්නේ. දැන් අන්තිම ප්‍රාර්ථනාව ගැන හිතනවා" ලෙස කීවේය. එවිට ආරියරත්න "මම කරලා තියෙන්නෙ මගේ රාජකාරිය මිසක් වෙන දෙයක් නොවෙයි. ඔහෙලත් ඔහේලගේ රාජකාරිය කැමැති විදියකට කරන්න" කියා පිළිතුර දුන්නේය.



*අමිත ආරියරත්න මහතා රෝහලේ දී*

ඉන්පසු ආරියරත්න හට සිහි නැති වෙන තුරු පහර දුන් අතර, ඔහුට සිහිය එන විට ඔහුගේ කලිසම ඔහුගේ කකුල් හරියට පහතට දමා තිබුනි. ඔහුගේ කමිසය, ජංගම දුරකථන දෙකක්, ජාතික හැඳුනුම්පත, නීතිඥ හැඳුනුම්පත, රුපියල් 30,000ක් පමණ වටිනා මුදල්, ඔහුගේ නිල ලේඛන සහ රබර් නිල මුද්‍රා සහිත කුඩා බෑගයක්, USB මතක චිප් 2-3 ක්, කණ්ණාඩි කුට්ටම සහ ඔරලෝසුව යන සියල්ල අතුරුදහන් වී තිබුනි.

පාර දෙසට අපහසුවෙන් පැමිණි ඔහුට තේරුම් ගත්තේ තමන් දලුපිටිය හන්දියට ආසන්නයේ ඔහුගේ නිවසේ සිට කිලෝමීටර් 3 ½ පමණ දුරින් ඇති ප්‍රදේශයක සිටින බවයි. ආරියරත්න ත්‍රිරෝද රථයක් නවතා ගැනීමට හෝ මග යන්නකුගෙන් උදවු ලබා ගැනීමට උත්සාහ කළත් සාර්ථක නොවූයෙන් සිය නිවස දෙසට පයින්ම ඇවිද යන්නට විය. රාගම නගරයට පැමිණීමෙන් පසුව කුලී ත්‍රිරෝද රථයකට නැගී ඔහු නිවසට ළඟා වෙන විට පාන්දර 2.25 පමණ විය.

ඔහු ගෙදරට ළඟා වීමෙන් පසුව, ආරියරත්නගේ බිරිඳ පොලිස් හදිසි ඇමතුම් අංකය ඇමතූ අතර, විනාඩි 45කට පමණ පසු පැමිණි පොලීසිය විසින් ආරියරත්නට කීවේ පොලිස් ස්ථානයට පැමිණ මේ ගැන පැමිණිල්ලක් කරන ලෙසයි. නමුත් සෞඛ්‍ය තත්වය යහපත් නොවූයෙන් ඔහු රාගම රෝහලට ඇතුළත් වූ අතර, පසුදින ඔහු රෝහලින් නැවත නිවසට පැමිණියේය. වෛද්‍ය වාර්තාවලට අනුව ආරියරත්නට පපුවේ, හිසේ සහ පිටේ තුවාල ඇත. පොලීසිය ආරියරත්න රෝහලේ සිටිය දී ප්‍රකාශයක් ලබා ගත්තේ නැති අතර, ආරියරත්න වෙනුවෙන් පොලීසියට ප්‍රකාශයක් ලබා දීමට ගිය ආරියරත්නගේ කණිෂ්ඨ නීතිඥයා සහ බිරිඳ පොලීසිය විසින් නොසලකා හරින ලදී.

ආරියරත්න තවදුරටත් හිසේ කැක්කුම් සහ කොන්දේ කැක්කුම් අතර, ඒ ගැන ආයුර්වේද ප්‍රතිකාර ලබා ගනිමින් සිටී.

## 27. *සේනක පෙරේරා*



*නීතිඥ සේනක පෙරේරා. ඡායාරූපය ඩේලි මිරර්*

සේනක පෙරේරා සිරකරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කමිටුවේ සභාපති වන අතර වෘත්තියෙන් නීතිඥයෙකි. ඔහු 2012 වර්ෂයේ දී සිරකරුවන් 27 දෙනෙකු ඝාතනය කරමින්, පොලීසිය, සොල්දාදුවන් සහ සිරගෙදර ආරක්ෂකයකු ඇතුළු, 40 දෙනෙකුට තුවාල සිදු කරමින් සිදු වූ වැලිකඩ සිරගෙදර කැරැල්ලේ වින්දිතයන් වෙනුවෙන් යුක්තිය ලබා ගැනීමේ ව්‍යාපාරයේ ප්‍රධාන පුද්ගලයෙකි. ක්‍රියාකාරීන් සහ ඇසින් දුටු සාක්ෂිකරුවන් චෝදනා කරන්නේ සිරකරුවන් සැලසුම් කර මරා දැමූ බවයි. අප්‍රේල් මාසයේ දී, හිටපු සිරකරුවෙක් මෙන්ම, ඇසින් දුටු සාක්ෂිකරුවකු සහ ක්‍රියාකාරිකයෙක් වන නන්දිමාල් ද සිල්වා වෙනුවෙන් රිට් අයදුම්පතක් යොමු කිරීම පෙරේරා මහතා විසින් සිදු කරන ලදී.

ජූලි 11 වැනිදා රාත්‍රී 7:45 පමණ, පෙරේරාට නොදන්නා පුද්ගලයෙක්ගෙන් ඔහු දිගටම මේ නඩුවට පෙනී සිටියහොත් මරා දමන බවට ජීවිත තර්ජනය කරමින් ඇමතුමක් ලැබුනි[52]. පෙරේරා මේ ගැන ගම්පහ දිස්ත්‍රික්කයේ නිට්ටඹුව පොලීසියේ පැමිණිල්ලක් කරන ලදී. මාධ්‍යයට කතා කරමින්, පෙරේරා පැවසුවේ මේ තර්ජනය ඊට සති දෙකකට පසුව ජූලි 28 වැනිදා තමන් මේ නඩුව සම්බන්ධයෙන් උසාවියේ පෙනී සිටීමට සැලසුම් කර තිබීමට සම්බන්ධ දෙයක් විය හැකි බවයි.

## 28. *සුදේශ නන්දිමාල් ද සිල්වා*

සුදේශ නන්දිමාල් ද සිල්වා වැලිකඩ හිරගෙදර හිටපු සිරකරුවක් මෙන්ම, 2011 වසරේ වැලිකඩ සිරගෙදර කැරැල්ලේ දී ප්‍රධාන සාක්ෂිකරුවෙකි. ඔහු නීතිඥ පෙරේරා ද නියෝජනය කරන සිරකරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කමිටුවේ ලේකම් ය.

එම දිනයේම, ආසන්න වශයෙන් නීතිඥයාට තර්ජනය කළ වෙලාවේම, ද සිල්වා හටත් තර්ජනාත්මක ඇමතුමක් ලැබුනි[53]. නීතිඥයාට සමාන ආකාරයෙන්ම, ද සිල්වා හට ද ජූලි 11 වැනිදා නඩුවට ඔහුගේ සම්බන්ධය අවසන් කරන ලෙස කියා ඇත. ඔහු පසුව මේ සිද්ධිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම

[52] http://www.dailymirror.lk/article/Key-eyewitness-lawyer-threatened-with-death-132788.html
[53] http://www.dailymirror.lk/article/Key-eyewitness-lawyer-threatened-with-death-132788.html

පොලීසියට වාර්තා කර ඇත. සැප්තැම්බර 4 වැනිදා, ඔහු නැවතී සිටින කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව පිහිටි නිවසට වෙඩි ප්‍රහාර එල්ල විය. ද සිල්වා ඒ ගැන ද පොලීසියට පැමිණිලි කරන ලදී.



*ඡායාරූපය : නන්දිමාල්ගේ නිවසේ ගේට්ටුවේ තිබූ වෙඩි තැබීමෙන් ඇති වූ සිදුරු*

2017 වසරේ දී ද සිල්වා හට වෙනත් තර්ජන කිහිපයක් ද සිදු වී ඇති අතර, ඉන් පෙර ද ඔහු තර්ජනවලට මුහුණ පා ඇත. පොලීසියට පැමිණිලි කළත්, තවමත් වගවිය යුතු කිසිවෙක් සොයා ගෙන නැත.

## vi. <u>මානව හිමිකම් ක්‍රියාධරයන් අපකීර්තියට ලක් කෙරෙන ප්‍රකාශ</u>

2017 වසර පුරා, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ හිටපු අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂ ඇතුළුව රජයේ ඉහළ නිලතල දරන නිලධාරීන් විසින් මානව හිමිකම් ක්‍රියාධරයන්ට, සහ රාජ්‍ය නොවන සංවිධාන සහ දේශීය සහ අන්තර්ජාතික මානව හිමිකම් ව්‍යාපාරවලට එරෙහිව ප්‍රකාශ නිකුත් කර ඇත. සිරිසේනගේ සංහිඳියාව ගනැ අන්තර්ජාතික වාගාලංකාරය, යුද්ධයේදී සිදු වූ අපරාධ සහ මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් වගවීම ගැන ඔහුගේ ප්‍රකාශ ශ්‍රී ලංකාව 2015 වසරේ දී සම-අත්සන් කරන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ අංක 30/1 ප්‍රඥප්තියේ පොරොන්දු සමග අතිශයින් පරස්පර විරෝධී වේ.

මේ ප්‍රකාශ තිබියදී වුවත්, රජය තුළ ජාතික සහජීවනය සහ සංවාද අමාත්‍ය මනෝ ගනේසන් වැනි ප්‍රගතශීලී කටහඬවල් ද කිහිපයක් ඇත. රාජ්‍ය නොවන සංවිධාන නියාමනය සම්බන්ධයෙන් රාජපක්ෂගේ අදහස්වලට පසුව, ගනේෂන් කීවේ ඔහු "පහසුකම් සැපයීම" යන වචනය පාවිච්චි කිරීමට වඩා කැමැති බවයි [54]. රාජපක්ෂගේ අදහස්වලට උත්තර දෙමින් ඔහු කීවේ: " මම දකින විදියට ජාතික සහජීවනයට වඩාත්ම බාධා ඇති වෙන්නේ ආගමික සහ දේශපාලනික බලපෑම්වලින් … බොහෝ රාජ්‍ය නොවන සංවිධාන රජයට සහ සංහිඳියාවට විරුද්ධ යැයි වැනි අදහසක් සාමාන්‍යකරණය කරන්න බැහැ" යනුවෙනි. ගනේෂන්ගේ ධනාත්මක අදහස් ජනාධිපති සිරිසේන සහ හිටපු අමාත්‍ය රාජපක්ෂ විසින් කරන ලද මර්දනකාරී ප්‍රකාශයන්හි විෂ නසන, සුබවාදී අදහස් වෙන අතරම, ඒවායින් ඒ අතරම පෙන්වන්නේ මානව හිමිකම් සම්බන්ධයෙන් රජයේ එකඟතාවය ගැන සාමූහික දැක්මක් නොමැති බවයි. ජාතික ආණ්ඩුවේ සාමාජිකයන්ගෙන් ලැබෙන මෙවැනි පරස්පර විරෝධී ප්‍රකාශ තුළින්, යහපාලනය සහ ඡන්දයේදී දුන් පොරොන්දු ඉටු කිරීමට ඇති කැමැත්ත සම්බන්ධයෙන් සැක සංකා මතු කරයි.

[54] http://srilankabrief.org/2017/07/sri-lanka-i-will-facilitate-but-not-regulate-ngos-minister-ganesan/

**29.** ***ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් කළ ප්‍රකාශ***

2017 වසරේදී ජනාධිපති සිරිසේන විසින් වගවීම් ක්‍රියාදාමයේ දී විදෙස් විනිසුරන් අඩංගු කිරීමට ඔහු විරුද්ධ බව සහ එවැනි නඩුවලදී "යුද විරුවන් ආරක්ෂා කිරීමේ" ඔහුගේ චේතනාව සම්බන්ධයෙන් කිහිප වතාවක්ම ප්‍රකාශ නිකුත් කර ඇත. මාර්තු 3 වැනිදා, යුද කාලයේ අපරාධ සම්බන්ධයෙන් වන නඩුවලදී විදේශ විනිසුරන් අඩංගු කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමින් ජනාධිපති සිරිසේනගේ කාර්යාලය විසින් ප්‍රකාශයක් නිකුත් කරන ලදී. ඔහුගේ ප්‍රකාශයේ දී, සිරිසේන ප්‍රකාශ කළේ "රාජ්‍ය නොවන සංවිධානවලට මගේ රජය කෙලෙස කටයුතු කළ යුතු ද යන්න තීරණය කළ නොහැකි බවයි". රාජපක්ෂ රෙජීමය යටතේ පැවැති, යුද කාලයේ සහ ඉන් පසුව මානව හිමිකම් ක්‍රියාකාරීත්වයට අවමන් කිරීම සහ එය මර්දනය කිරීමට යොදා ගත් රාජ්‍ය නොවන සංවිධාන විරෝධී කතිකාව මෙයින් මතක් කළේය.

සැප්තැම්බර් 3 වැනිදා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 66 වැනි සංවත්සරයේදී සිරිසේන ප්‍රතිඥා දුන්නේ හමුදා නායකයන් පොදුවේ ආරක්ෂා කරන බවත්, හිටපු හමුදා අණ දෙන නිලධාරී ජෙනරාල් ජගත් ජයසූරිය විශේෂයෙන්ම "අන්තර්ජාතික ප්‍රජාවෙන්" ආරක්ෂා කරන බවත්ය[55]. මේ අදහස් මතු කරන ලද්දේ බ්‍රසීලයේ සහ කොලම්බියාවේ මානව හිමිකම් කණ්ඩායමක් විසින් ජයසූරිය (එවකට බ්‍රසීලයට සහ තවත් ලතින් ඇමෙරිකානු රටවල් කිහිපයක තානාපති) ශ්‍රී ලංකා යුද හමුදාව විසින් සිදු කළ චෝදිත යුද අපරාධවලට තදින් සම්බන්ධ බවට චෝදනා කරමින් පවරන ලද නඩුවකට ප්‍රතිචාර ලෙස ය[56]. මේ කතාවේදීම, ජනාධිපති විසින් ප්‍රකාශ කළේ ඔහු රාජ්‍ය නොවන සංවිධානවල "තාලයට නටන්නේ නැති බවයි". මෙය සිවිල් සංවිධාන දැන් ක්‍රියාත්මක නොවන එල්ටීටීඊය සමග සම්බන්ධතා දක්වන බවත්, එයින් මුදල් ලබා ගන්නා බවත් කියමින් සිවිල් සංවිධානවට අපහාස කිරීමේ පැරණි උපාය මාර්ගයේ ම යොදා ගැනීමකි.

මේ සිද්ධි දෙකින් පසුව, සැප්තැම්බර් මාසයේ දේශීය මාධ්‍යවල පළ වූ පොලිස්පති පූජිත් ජයසුන්දරගේ ප්‍රකාශයකට අනුව ජනාධිපති සිරිසේන සහ අගමැති රනිල් වික්‍රමසිංහ "විදේශ ආධාර මත සහ ජාවාරම්කරුවන් මත යැපෙන රාජ්‍ය නොවන සංවිධාන" ඉවසන්නේ නැති බැව් කියන ලදී. මේ අදහස්වලින් පෙනෙන්නේ ඉහළ නිලතල දරන රාජ්‍ය දේශපාලනඥයන් විසින් කරන මර්දනකාරී වාගාලාපයන් විසින් පොලිස්පති ජයසුන්දර වැනි වෙනත් නිලධාරීන්ට ද එවැනි ප්‍රකාශ කිරීමට ධෛර්යය ලබා දිය හැක්කේ කෙසේද යන්නයි[57].

නැවතත් දෙසැම්බර් 19 වැනිදා, කොළඹ, ගලදාරි හෝටලයේ පැවැති, අධිකරණ නිලධාරීන්ගේ වාර්ෂික සමුළුවක් අමතමින්, සිරිසේන අවධාරණය කළේ පශ්චාත්-යුද වගවීම් ක්‍රියාදාමයේ දී විදේශ විනිසුරන් ඇතුළු කිරීමට ඔහුගේ විරුද්ධත්වයයි[58]. ඩේලි එෆ් ටී පුවත්පත වාර්තාකළ පරිදි "පිටරට සිටින ඇතැම් එල්ටීටීඊ සාමාජිකයන් සහ සමහර සංවිධානවල සාමාජිකයන් මෙන්ම එල්ටීටීඊය සමග සම්බන්ධකම් ඇති රාජ්‍ය නොවන සංවිධාන මේ ගැන විවිධ ප්‍රකාශ සිදු කරන අය සහ කාරණය (වගවීම) අත් නොහැර සිටින්නන්" බවයි."

[55] http://www.adaderana.lk/news/42829/president-vows-to-protect-sri-lankas-military-commanders-war-heroes-
[56] http://www.aljazeera.com/amp/news/2017/08/brazil-lawsuit-accuses-jagath-jayasuriya-war-cimes-170829055025990.html
[57] http://www.dailymirror.lk/article/Prez-PM-won-t-tolerate-NGOs-surviving-on-foreign-aid-IGP-140297.html
[58] http://tamilguardian.com/content/sri-lankan-president-blames-ngos-calling-foreign-judges

**30.** ***රාජ්‍ය නොවන සංවිධාන සහ LGBTIQ ප්‍රජාවට විරුද්ධව හිටපු අධිකරණ අමාත්‍ය රාජපක්ෂ විසින් කරන ලද ප්‍රකාශ***

ජුනි 22 වැනිදා සිලෝන් ටුඩේ පුවත්පතේ පළ වූ සම්මුඛ සාකච්ඡාවක දී, අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂ විසින් චෝදනා කළේ රාජ්‍ය නොවන සංවිධාන විසින් රට අස්ථාවර කිරීමට උත්සාහ කරන බවත්, ප්‍රජාවන් අතර කලබල ඇති කර ආධාර ලබා ගැනීමට උත්සාහ කරන බවත් ය. මෙහිදී කිසිදු නිශ්චිත උදාහරණයක් සැපයුවේ නැත[59]. මෙහිදී රාජපක්ෂ උත්සාහ කරන්නේ රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීන් පාවාදෙන්නන් ලෙස සලකුණු කිරීමටත්, සුළුතරයන් වෙනුවෙන් වැඩකරන රාජ්‍ය නොවන සංවිධාන සිංහල බෞද්ධ විරෝධී ප්‍රචාරක කටයුතුවල යෙදෙන බවට චෝදනා කිරීමටත්ය.

රාජපක්ෂ විසින් මීට සමාන අදහස්ම ජුනි 29 වැනිදා ඩේලි මිරර් පුවත්පතේ පළ වූ සමාන සාකච්ඡාවක දී පළ කළ අතර, එහිදී ඔහු රාජ්‍ය නොවන සංවිධාන නියාමනය කිරීමට තද නීතිරීති ගෙන ආ යුතු බව ද කීවේය. වසර 3කට පෙර රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය ආරක්ෂක අමාත්‍යාංශයේ නිරීක්ෂණය යටතේ තිබුනු රටක මෙය ඉතා කනස්සළු සහගත ප්‍රකාශයකි[60]. සාකච්ඡාවේ දී රාජපක්ෂ තවදුරටත් චෝදනා කළේ "රාජ්‍ය නොවන සංවිධාන බොහොමයක අරමුණු ජාතික අභිලාෂයන්ට ඉතා දරුණු ලෙස හානිකර" වෙන බවයි."

2017 අගොස්තු වන විට, රාජපක්ෂ ඔහුගේ අධිකරණ අමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස් වූ අතර, පසුව ඔහු සඳහන් කළේ තමන්ව එයින් පහ කළ බවයි[61]. මේ තීරණය ගත්තේ අමාත්‍යවරයා විසින් චීනය සමග පැවැති හම්බන්තොට වරාය ගිවිසුම විවේචනය කිරීමට ප්‍රතිචාරයක් වශයෙන් වීම සඳහන් කළ යුතුය. එබැවින් රාජපක්ෂට ඔහු විසින් මානව හිමිකම් ක්‍රියාධරයන්ට මුස්ලිම්, සහ LGBTIQ ප්‍රජාව වැනි සුළුතර කණ්ඩායම්වලට එරෙහිව ඔහු සිදු කරන ලද ප්‍රකාශයන්ට විරුද්ධ කිසිසේත්ම නිල වශයෙන් පියවරයක් ගත්තේ නැත.

ජනවාරි 22 වැනිදා, රාජපක්ෂ ශ්‍රී ලංකාවේ සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, කුයර් සහ අවිනිශ්චිත (LGBTIQ) ප්‍රජාවට විරුද්ධව ප්‍රකාශ සිදු කළේ, රටේ පවතින නීතිමය තත්වය නිසා බියෙන් සහ සැඟවී ජීවත්වෙන, තමන්ගේ අනන්‍යතාවය ප්‍රකාශ කළ නොහැකි තත්වයක් ඔවුනට තිබිය දීය[62]. තිස්සමහාරාමයේ පැවැති දිස්ත්‍රික් උසාවියක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගි වෙමින් ඔහු ප්‍රකාශ කළේ සමලිංගිකත්වය යනු "සංස්කෘතියට නොගැලපෙන දෙයක්" බවත්, එය "මානසික රෝගයක්" බවත්ය. මෙවැනි ප්‍රකාශයක් LGBTIQ ක්‍රියාකාරීත්වය තදබල මර්දනයකට මුහුණ පාන රටක නීතිය භාර ඉහළ තනතුරක් දරන අමාත්‍යවරයකුගෙන් පැමිණීම ගැඹුරින් විමසා බැලිය යුතුය.

[59] http://www.ceylontoday.lk/print20170401CT20170630.php?id=23826
[60] http://www.dailymirror.lk/article/Laws-needed-to-regulate-NGOs--131852.html
[61] https://www.colombotelegraph.com/index.php/i-did-not-resign-i-was-sacked-double-doctor-wijeyadasa-rajapakshe/
[62] https://www.colombotelegraph.com/index.php/homophobic-justice-minister-wijeyadasa-should-resign-right-activists/